සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2024
Third Term Test - Grade 13 - 2024

විභාග අංකය: ..................................

# ආර්ථික විද්‍යාව - I

කාලය පැය 02 යි

උපදෙස්
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා උත්තර පත්‍රයේ නියමිත පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.

(01) පහත සඳහන් ප්‍රකාශ අතුරින් සාර්ව ආර්ථික විද්‍යාත්මක ප්‍රකාශය තෝරන්න.
(1) ආන්තික ඵලදාව ඉහළ යන විට ආන්තික පිරිවැය පහළ යයි.
(2) පසුගිය වසරට සාපේක්ෂව සමස්ත අයවැය හිඟය පහළ ගොස් ඇත.
(3) පසුගිය වසරට සාපේක්ෂව මෙම වසරේ සහල් මිල පහළ ගොස් ඇත.
(4) නිෂ්පාදන ආයතනයක සම්පත්වල කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට නම් මාර්ග පද්ධතිය දියුණු කළ යුතුය.
(5) ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථිකය ඉහළ නැංවීමට නම් මාර්ග පද්ධතිය දියුණු කළ යුතුය.

(02) ආර්ථික නොවන භාණ්ඩයක් (Non-economic goods) ලෙස හැඳින්වෙන්නේ,
(1) වෙළෙඳපොළේ හුවමාරු වුවද ආර්ථික වටිනාකමක් නොමැති භාණ්ඩ ය.
(2) මිලක් නොමැති වුවද සම්පත් පිරිවැයක් රහිත භාණ්ඩ ය.
(3) පරිභෝජනයේ ආවස්ථික පිරිවැය ශුන්‍ය භාණ්ඩ ය.
(4) වෙළෙඳපොළේ දී මිලක් අය කළ නොහැකි භාණ්ඩ ය.
(5) සාපේක්ෂව සැපයුම් ඌනතාවක් සහිත භාණ්ඩ ය.

(03) රූප සටහනේ පරිදි නිෂ්පාදන හැකියා මායිම විතැන්වීමට බලපාන හේතුවකි.




(1) සම්පත් හිඟවීම
(2) ආර්ථික පසුබෑසීම
(3) සේවක වැඩ වර්ජන
(4) වගා නොකළ ඉඩම් පැවතීම
(5) කළමනාකරණ දුර්වලතා

(04) වර්තමානයේ ආර්ථික පද්ධතිවල නව ප්‍රවණතාවක් ලෙස සමාජීය වෙළෙඳපොළ ආර්ථික පද්ධති සැලකිය හැකිය. එවැනි සමාජීය වෙළෙඳපොළ ආර්ථිකයක කැපී පෙනෙන ලක්ෂණයකි.
(1) මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමේදී තීරණ ගැනීමේ ක්‍රියාවලිය ආගමික දෘෂ්ටිවාදය මත පදනම් වීම.
(2) පොදු දේපොළ හිමිකාරීත්වය තහවුරු කරමින් පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන අවස්ථාවල දී රජය විසින් ආරක්ෂාව සැපයීම.
(3) දේශපාලන අධිකාරිය ලබා දෙන මඟ පෙන්වීම මත සැලසුම් සකස්කිරීම හා ක්‍රියාත්මක කිරීම.
(4) ආර්ථිකය තුළ රාජ්‍ය අංශය ඉටු කරන ආර්ථික කටයුතු පෞද්ගලික අංශය විසින් නියාමනය කිරීම.
(5) පෞද්ගලික දේපොළ අයිතිය, නිදහස් තේරීම හා තරඟය යන මූලික ප්‍රතිපත්ති මත පදනම් ව සමාජ සාධාරණත්වය තහවුරු කිරීම.

(05) පහත සඳහන් දෑ අතුරින් පාරිභෝගික ඉල්ලුමට <u>බලනොපාන</u> සාධකය වන්නේ කුමක්ද?
(1) පාරිභෝගික රුචිය
(2) සලකා බලන භාණ්ඩයේ මිල
(3) පාරිභෝගික ආදායම
(4) පාරිභෝගිකයන්ගේ අනාගත මිල අපේක්ෂා
(5) පාරිභෝගික සංඛ්‍යාව

(06) ආදායම් ඉල්ලුම් නම්‍යතාව සහ මිල ඉල්ලුම් නම්‍යතාව යන දෙකම සෘණ අගයක් ගනු ලබන භාණ්ඩයක ඉල්ලුම් වක්‍රය රූප සටහනෙහි දැක්වේ. මෙම භාණ්ඩයේ ඉල්ලුම් වක්‍රය වමට විතැන් වීමට නම්,




(1) මිල අඩු විය යුතුය.
(2) ආදායම අඩු විය යුතුය.
(3) ආදායම ඉහළ යා යුතුය.
(4) මිල ඉහළ යා යුතුය.
(5) මිල වැඩි වී ආදායම පහළ යා යුතුය.

(07) සාමාන්‍ය භාණ්ඩයක මිල අඩු වන විට මූර්ත ආදායම ඉහළ යාමක් සිදු වූයේ නම්,
(1) ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වේ.
(2) ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වැඩි වේ.
(3) ඉල්ලුම් වක්‍රය මත පිහිටි ලක්ෂ්‍යය පහළ බසී
(4) මිලට ගනු ලබන ප්‍රමාණය අඩු කරයි.
(5) ඉල්ලුම් වක්‍රය වමට විතැන් වේ.

(08) එක්තරා භාණ්ඩයක මිල රු. 16 දී ඉල්ලුම් නම්‍යතාව - 5.0 කි. තවද එම මිලේදී ඉල්ලුම් ප්‍රමාණය ඒකක 320 කි. ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය දෙගුණයක් වීමට නම් භාණ්ඩයේ මිල,
(1) රුපියල් 6 ක් විය යුතුය.
(2) රුපියල් 2 ක් විය යුතුය.
(3) රුපියල් 3.50 කින් අඩු විය යුතුය.
(4) රුපියල් 3.20 කින් අඩු විය යුතුය.
(5) රුපියල් 5.50 ක් විය යුතුය.

(09) $QS = a + bp$ ආකාරයේ සරල රේඛීය සැපයුම් වක්‍රයක මිල රු. 4.00 දී සැපයුම් නම්‍යතාව 2 ක් වූයේ නම් මිල රු. 3.50 දක්වා පහළ ගියහොත් සැපයුම්නම්‍යතාව,
(1) 2 ට වඩා අඩු විය යුතු අතර 1 ට වඩා වැඩි විය යුතුය.
(2) 2 ට වඩා වැඩි විය යුතුය.
(3) 1 ක් විය හැක.
(4) 2 ට වඩා අඩු විය යුතුය.
(5) 0-1 ත් අතර අගයක් ගත යුතුය.

(10) එක්තරා වෙළෙඳපොළක සමතුලිතයට අදාළ ඉල්ලුම් හා සැපයුම් තත්ත්වයන් පහත සමීකරණ වලින් පෙන්නුම් කරයි.
නිමැවුම ඒකක 35 දීඅධි සැපයුම් මිල කොපමණද?

$$Qd = 80 - 3p$$
$$P = 10 + 0.5\,Qs$$

(1) රු. 10 කි.
(2) රු. 12 කි.
(3) රු. 15 කි.
(4) රු. 12.50 කි.
(5) රු. 10.50 කි.

(11) සමතුලිතතාවයේ පවතින සාමාන්‍ය භාණ්ඩයක් සඳහා වන පෙළෙඳපොළක ඉල්ලුම අඩු වනවාට වඩා වැඩි වේගයකින් සැපයුම වැඩි වේ නම්, වෙළඳපොළේ සිදුවිය හැකි වෙනස්කම් දැක්වෙන නිවැරදි වරණය තෝරන්න.
(1) සමතුලිත මිල අඩු වේ. සමතුලිත ප්‍රමාණය වැඩි වේ.
(2) සමතුලිත මිල වැඩි වේ. සමතුලිත ප්‍රමාණය වැඩි වේ.
(3) සමතුලිත මිල අඩු වේ. සමතුලිත ප්‍රමාණයේ වෙනස් වීම අවිනිශ්චිත වේ.
(4) සමතුලිත මිල හා ප්‍රමාණය සමාන ප්‍රමාණයන්ගෙන් අඩු වේ.
(5) සමතුලිත මිල වැඩි වේ. සමතුලිත ප්‍රමාණය අඩු හෝ වැඩි වේ.

(12)




X භාණ්ඩය සඳහා වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර ඉහත රූප සටහන පෙන්නුම් කරයි. මෙම වෙළෙඳපොළ තුළ සිටින නිෂ්පාදකයින්ට ඒකකයකට රුපියල් 40 ක් වන විශේෂිත බද්දක් ආණ්ඩුව විසින් පනවනවා යැයි සිතන්න. බද්දෙහි ප්‍රතිඵලයක් වශයෙන්,

(1) නිෂ්පාදක අතිරික්තය රුපියල් 2000 කින් අඩු වේ.
(2) පාරිභෝගික අතිරික්තය රුපියල් 2000 කින් අඩු වේ.
(3) රජයේ බදු අයභාරය රුපියල් රුපියල් 12000 කින් ඉහළ යයි.
(4) අහිමිවන ආර්ථික අතිරික්තය රුපියල් 2000 කි.
(5) ඒකක 200 ක ඌන නිෂ්පාදනයක් හටගනී.

(13) තරගකාරී වෙළඳපොළක අලෙවිකරන කිසියම් නිෂ්පාදිතයක් සඳහා ඇති ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත සමීකරණ මගින් නිරූපණය කෙරේ.

$Qd = 720 - 4P$ (ඉල්ලුම් සමීකරණය) $Qs = -120 + 2P$ (සැපයුම් සමීකරණය)

මෙම භාණ්ඩයේ ඒකකයක් මත රුපියල් 15 ක් බැගින් වන විශේෂිත සහනාධාරයක් නිෂ්පාදකයන්ට ලබාදීමට රජය කටයුතු කරන්නේ නම් සහනාධාරයෙන් පසු නිෂ්පාදන අයභාරය සහ සහනාධාරයෙන් පසු පාරිභෝගික අතිරික්තයේ හටගන්නා වැඩිවීම කොපමණද?

| | සහනාධාරයෙන් පසු නිෂ්පාදක අයභාරය (රු.) | පාරිභෝගික අතිරික්තයේ වැඩි වීම (රු.) |
|---|---|---|
| (1) | 27 000 | 850 |
| (2) | 27 000 | 1700 |
| (3) | 24 300 | 850 |
| (4) | 24 300 | 1700 |
| (5) | 24 000 | 2550 |

(14) වෙළෙඳපොළ ක්‍රමයකට රජය මැදිහත් වී අවම මිලක් ප්‍රකාශයට පත් කිරීම නිසා හටගත හැකි ප්‍රතිවිපාක සම්බන්ධව දී ඇති ප්‍රකාශ අතරින් සාවද්‍ය ප්‍රකාශය කුමක්ද?

(1) පාරිභෝගිකයන් භාණ්ඩ සඳහා ගෙවන මිල වැඩි වී මිලදී ගන්නා ප්‍රමාණය අඩු කරනු ඇත.
(2) සමතුලිත මිලට පහළින් අවම මිල නියම කරනු ලැබුවහොත් රජය මැදිහත්වීමේ අරමුණ ඉටු නොවනු ඇත.
(3) මිල නොවන සලාකන ක්‍රම හටගැනීම මගින් වෙළඳපොළ යාන්ත්‍රණය නිෂ්ක්‍රීය වනු ඇත.
(4) හිඟ සම්පත් බෙදී යාම පිළිබඳව අකාර්යක්ෂමතා බිහිවනු ඇත.
(5) ශ්‍රම වෙළඳපොළ තුළ අවම වැටුප් නියම කිරීමෙන් සේවා නියුක්තිය අඩුවනු ඇත.

(15) නිෂ්පාදන ආයතනය වාර්ෂික නිෂ්පාදන පිරිවැය හා සම්බන්ධ දත්ත කීපයක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| සේවක වැටුප් හා වේතන | රු. | 45000 |
| අමුද්‍රව්‍ය සඳහා වියදම් | රු. | 8000 |
| ගොඩනැගිල්ල සඳහා ගෙවූ බදුකුලිය | රු. | 9000 |
| අලෙවි පිරිවැය | රු. | 6000 |
| බැංකු ණය, සඳහා ගෙවූ පොළිය | රු. | 7500 |
| අහිමි පොළි ආදායම | රු. | 4500 |
| අහිමි වැටුප් අදායම | රු. | 12000 |

මෙම නිෂ්පාදන ආයතනයේ ගණකාධිකාරී පිරිවැය හා ආර්ථික පිරිවැය පිළිවෙලින්,

(1) රු. 75500 හා රු. 16500 කි.
(2) රු. 75000 හා රු. 4500 කි.
(3) රු. 16500 හා රු. 92000 කි.
(4) රු. 75500 හා රු. 92000 කි.
(5) රු. 92000 හා රු. 12000 කි.

(16) නිෂ්පාදන ආයතනයක් කෙටිකාලයේදී නිෂ්පාදනයේ යෙදෙනවාද නැතිනම් නොයෙදෙනවාද යන තීරණය ගැනීමට අදාළ වන්නේ,

(1) භාණ්ඩය අලෙවිකරන මිල එහි සාමාන්‍ය ස්ථාවර පිරිවැය ඉක්මවා යනවාද නැද්ද යන්නයි.
(2) භාණ්ඩයේ ආන්තික අයභාරය එහි ආන්තික පිරිවැය ඉක්මවා යනවාද නැද්ද යන්නයි.
(3) භාණ්ඩය අලෙවිකරන මිල එහි සාමාන්‍ය විචල්‍ය පිරිවැය ඉක්මවා යනවාද නැද්ද යන්නයි.
(4) භාණ්ඩයේ සාමාන්‍ය මුළු පිරිවැය ආන්තික පිරිවැයට සමාන වනවාද නැද්ද යන්නයි.
(5) භාණ්ඩයේ සාමාන්‍ය මුළු පිරිවැය එහි විචල්‍ය පිරිවැයට සමාන වනවාද නැද්ද යන්නයි.

(17) ටයර් නිෂ්පාදනයේ යෙදී සිටින නිෂ්පාදන ආයතනයක් තම නිෂ්පාදනය සඳහා දරනු ලබන ස්ථාවර පිරිවැය 50% කින් වැඩි කරන ලදී. මෙම ආයතනයේ ආන්තික පිරිවැයට කුමක් සිදුවිය හැකිද?

(1) 50% කින් ඉහළ යනු ඇත.
(2) 50% කින් පහළ යනු ඇත.
(3) දෙගුණයකට වඩා වැඩි වනු ඇත.
(4) 100% කින් අඩු වනු ඇත.
(5) ස්ථාවරව පවතිනු ඇත.

(18) වෙළඳපොළ ව්‍යුහ අතුරෙන් ඒකාධිකාරී තරඟ වෙළෙඳපොළ ව්‍යුහය තුළ සාපේක්ෂව දක්නට ලැබෙන ලක්ෂණයක් වන්නේ පහත සඳහන් ඒවායින් කවරක්ද?

(1) එක් ආයතනයක් පමණක් දක්නට ලැබීම.
(2) නිෂ්පාදනය පිළිබඳ ප්‍රචාරණයක් සිදු නොවීම.
(3) සමජාතීය භාණ්ඩ නිෂ්පාදනය කරන ආයතන විශාල සංඛ්‍යාවක් සිටීම.
(4) ප්‍රභේදනය වූ භාණ්ඩ නිෂ්පාදනය කරන ආයතන විශාල සංඛ්‍යාවක් සිටීම.
(5) වෙළෙඳපොළ මිල භාර ගන්නා ආයතන සුළු ප්‍රමාණයක් දක්නට ලැබීම.

(19) වෙළෙඳපොළ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය ලබා ගත හැක්කේ කවර ගැලපුම මගින්ද?

(1) ප්‍රාථමික ආදායම් + විදේශීය ප්‍රාථමික ආදායම් ලැබීම.
(2) සේවක ආදායම් + දේපල ආදායම් + නිෂ්පාදනය හා ආනයන මත ශුද්ධ බදු + ශුද්ධ විදේශීය ප්‍රාථමික ආදායම්
(3) වැයකළ හැකි දළ ජාතික ආදායම් - ගෙවුම් තුලන ලේඛනයේ ජංගම ගිණුමේ ශේෂය + විදේශීය ශුද්ධ ආයෝජන
(4) වැයකල හැකි දළ ජාතික ආදායම - ශුද්ධ විදේශීය ආයෝජන
(5) මූලික මිලට ගණනය කරන ලද දළ නිමැවුමේ වටිනාකම - අතරමැදි පරිභෝජන වියදම

(20) සැගවුණු ආර්ථිකය (underground economy) තුළට අයත් නොවන ආර්ථික ක්‍රියාකාරකම මින් කුමක්ද?

(1) අනවසර කැලෑ කැපීම හා අනවසර වැලි ගොඩ දැමීම.
(2) නීත්‍යානුකූල වීසා බලපත්‍රයක් නොමැතිව රටක් තුළ රැඳී සිටීමෙන් ආදායම් ඉපයීම.
(3) සැබෑ ආදායම් ප්‍රකාශ හෙළි නොකරන සිල්ලර වෙළඳාම
(4) බලපත්‍රලාභී මත්පැන් අලෙවිසැලක මත්පැන් වෙළඳාම
(5) බලපත්‍ර රහිත වෛද්‍ය වෘත්තිකයන්ගේ සේවාවන්

(21) ''2023 වසරේ ආදායම් ඇස්තමේන්තුවලට අනුව ශ්‍රී ලංකා ආර්ථිකයේ දළ එකතු කළ අගයට වැඩිම දායකත්වයක් ලබා දී ඇති ප්‍රාථමික ආදායම් සංරචකය වන්නේ දළ මෙහෙයුම් අතිරික්තයයි.'' දළ මෙහෙයුම් අතිරික්තයේ වටිනාකම,

(1) සමාගමික අංශයේ ව්‍යවසායකයන් ජනනය කරන සියලු ආදායම්වල වටිනාකමට සමාන වේ.
(2) සමාගමික අංශයේ ව්‍යවසායකයන් නිෂ්පාදනය කරන ලද දළ නිමැවිමේ වටිනාකමින් අතරමැදියෙදවුම් අඩුකළ විට ලැබෙන ශේෂයට සමාන වේ.
(3) පොලී, බදු කුලී යන දේපල ආදායම් සංරචක වල වටිනාකමට සමාන වේ.
(4) සමාගමික අංශයේ ව්‍යවසායන් විසින් ජනනය කරන ලද දළ එකතු කළ අගයට සමාන වේ.
(5) සමාගමික අංශයේ ව්‍යවසායන් විසින් ජනනය කරන ලද දළ එකතු කළ අගයෙන් වැටුප් අඩු කළ විට ලැබෙන ශේෂයට සමාන වේ.

(22) පහත දැක්වෙන ජාතික ගිණුම් දත්තයන්හි සීමාවන් අතරින් ජාතික ගිණුම් අධිතක්සේරු වීමට හේතු වියහැකි සාධකය කුමක්ද?

(1) ආර්ථිකය තුළ සිදුවන සියලුම ඵලදායි ක්‍රියා පිළිබිඹු නොවීම.
(2) නොවිධිමත් ආර්ථික ක්‍රියාවල දායකත්වය නිවැරදිව පිළිබිඹු නොවීම.
(3) ජෛව විවිධත්වය අහිමිවීම හේතු කරගෙන වත්කම්වල හටගන්නා වටිනාකමේ වෙනස්කම් ඇතුළත් නොවීම.
(4) රාජ්‍ය ණය පොලී කුටුම්භ ආදායමට ඇතුළත් වුවද ජාතික ගිණුම්කරණයේදී සංක්‍රාම ලෙස බැහැර කිරීම.
(5) විවේක කාලය නිෂ්පාදිතයේ වටිනාකම තුළට ප්‍රවේශ නොවීම.

(23) කල්පිත ආර්ථිකයක වැය කළ හැකි ආදායම රුපියල් මිලියන 10 000 දී පරිභෝජන වියදම රුපියල් මිලියන 9000 කි. වැයකළ හැකි ආදායම රුපියල් මිලියන 20000 දක්වා වැඩිවන විට පරිභෝජන වියදම රුපියල් මිලියන 14000 ක් දක්වා වැඩි කරයි නම් මෙම ආර්ථිකයේ ස්වායත්ත පරිභෝජන වියදම හා ගුණකයේ අගය කොපමණද?

| | ස්වායක්ත පරිභෝජන වියදම (රු. මි.) | ගුණකයේ අගය |
|---|---|---|
| (1) | 4000 | 5 |
| (2) | 4000 | 2 |
| (3) | 6000 | 4 |
| (4) | 6000 | 3 |
| (5) | 6500 | 2 |

(24) රජයේ මැදිහත්වීමක් නොමැති එක්තරා ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතයට අදාළ සමීකරණය පහත පරිදි වේ.

$C = 40 + 0.8\,Yd$

දැන් රජය ස්ථාවර බදු ක්‍රමයක් හඳුන්වා දී දළ දේශීය නිෂ්පාදිතයේ සෑම මට්ටමකදීම රුපියල් බිලියන 20 ක් බදු වශයෙන් එකතු කර රුපියල් බිලියන 10 ක් සංක්‍රාම ලෙස ගෙවනු ලබන්නේ යැයි සිතන්න. එහි ප්‍රතිඵල වශයෙන් දළ දේශීය නිෂ්පාදිතය රුපියල් බිලියන 500 ක් වන විට මෙම ආර්ථිකයේ පරිභෝජන වියදම කොපමණද?

(1) රුපියල් බිලියන 424 (2) රුපියල් බිලියන 432 (3) රුපියල් බිලියන 436
(4) රුපියල් බිලියන 440 (5) රුපියල් බිලියන 490

(25) සමතුලිත තත්ත්වයේ පවතින සරල ආර්ථිකයක ඉතුරුම් හා ආයෝජන වක්‍රවල හැසිරීම පහත රූප සටහන පෙන්නුම් කරයි.




මෙම ආර්ථිකයේ වර්තමාන නිමවුම $Y_1$ මගින් ද, විභව නිමැවුම $Y_F$ මගින් ද පෙන්නුම් කරන්නේ යැයි සලකන්න. ඉහත රූප සටහනේ තොරතුරු වලට අනුව මෙම ආර්ථිකයේ,

(1) සැබෑ නිමැවුම විභව නිමැවුමට වඩා වැඩි වේ.

(2) $Y_1$-$Y_F$ ප්‍රමාණයෙන් උද්ධමනාත්මක නිමැවුම් පරතරය පෙන්නුම් කරයි.

(3) පූර්ණ සේවා නියුක්ති සමතුලිත ආදායම් මට්ටමක් පවතී.

(4) සේවා වියුක්තිය සහිත සමතුලිත නිමැවුමක් පවතී.

(5) a - b දුරින් සැලසුම් නොකළ තොග සමුච්චය පෙන්නුම් කරයි.

(26) ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු තම ව්‍යවස්ථාපිත සංචිත තබා ගනුයේ,

(1) මහ බැංකුවේ පවත්වාගනු ලබන තැන්පතු සහ විදේශ ව්‍යවහාර මුදල් වශයෙනි.

(2) ක්ෂණිකව ලබාගත හැකි වෙනත් වාණිජ බැංකු වල තැන්පතු වශයෙනි.

(3) අතැති මුදල් සහ මහ බැංකු තැන්පතු වශයෙනි.

(4) බැංකුවේ සේප්පුවල ඇති රත්‍රං සහ විදේශ ව්‍යවහාර මුදල් වශයෙනි.

(5) ක්ෂණිකව ලබාගත හැකි වෙනත් වාණිජ බැංකුවල තැන්පතු වශයෙනි.

(27) පහත සඳහන් කවර කරුණක ප්‍රතිඵලයක් වශයෙන් මුදල් සැපයුම වැඩිවන්නේද?

(1) මහ බැංකුව විසින් ලිහිල් මූල්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවීම.

(2) මහ බැංකුවේ විදේශ වත්කම් පහළ වැටීම.

(3) වට්ටම් අනුපාතය ඉහළ නැගීම.

(4) මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට පිළිනපත් අලෙවි කිරීම.

(5) මහ බැංකුව විසින් නිත්‍ය තැන්පතු අනුපාතිකය ඉහළ නැංවීම.

(28) පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය සඳහා පහත සඳහන් කවරක් හේතු වේද?

(1) ලෝක වෙළෙඳපොළේ බනිජතෙල් මිල තියුණු ලෙස පහළ යාම.

(2) රජය භාණ්ඩ හා සේවා මිලදී ගැනීම් අඩු කිරීම.

(3) වෘත්තීය සමිති සිය ඵලදායිතාවට වඩා වැඩිවේගයෙන් වැටුප් ඉහළ නංවා ගැනීම.

(4) හිතකර කාලගුණික තත්ත්වයක් පැවතීම.

(5) දේශීය මුදලේ විදේශීය අගය ඉහළ යාම.

(29) වාණිජ බැංකු පද්ධතිය තුළ අධි සංචිත පවත්වා නොගන්නා බවත්, වාණිජ බැංකු ක්‍රියාත්මක වන්නේ 20% ක ව්‍යවස්ථාපිත සංචිත මත බවත්, මෙම බැංකු තුළ රුපියල් මිලියන 2000 ක් වටිනා මහජනතාවගේ තැන්පතු පවතින බවත් උපකල්පනය කරන්න. මේ අතර මහජනතාව තමන් සතු රුපියල් මිලියන 200 ක ව්‍යවහාර මුදල් බැංකු වල තැන්පත් කරයි නම්, වාණිජ බැංකු ණය දීම මගින් අවශ්‍ය ගැළපුම් කළ පසු බැංකු ක්‍රමය තුළ පවත්නා මුළු තැන්පතු ප්‍රමාණය කොපමණ වේද?

(1) රුපියල් මිලියන 2800 (2) රුපියල් මිලියන 3000

(3) රුපියල් මිලියන 8200 (4) රුපියල් මිලියන 9000

(5) රුපියල් මිලියන 11000

(30) වාණිජ බැංකු අධි සංචිත පවත්වා ගැනීමට කටයුතු කරන විට,

(1) බැංකු තැන්පතු ප්‍රසාරණ ගුණකය ඉහළ යාමේ ප්‍රවනතාවක් හට ගනී.
(2) බැංකු පද්ධතියේ ඉල්ලුම් තැන්පතු මැවීමේ හැකියාව වැඩි වේ.
(3) බැංකු පද්ධතිය තුළ ණය මැවීමේ හැකියාව සීමා වේ.
(4) මූල්‍ය වෙළෙඳපොළේ පොලී අනුපාතිකය පහළයාමේ ප්‍රවනතාවක් හට ගනී.
(5) බැංකු තැන්පතු ප්‍රසාරණ ගුණකය පහළ යාමේ ප්‍රවනාතාවක් හටගනී.

(31) පරිභෝජනයේ තරගකාරීත්වයක් නොමැති සහ පරිභෝජනයෙන් බැහැර කරලීමේ හැකියවක් නොමැති භාණ්ඩයක් තවත් පුද්ගලයෙකුට භාවිත කිරීමට අවස්ථාව ලබාදීමේ ආන්තික සමාජ පිරිවැය,

(1) ඉහළ නගී. (2) අපරිමිත වේ. (3) ධන වේ. (4) ශුන්‍ය වේ. (5) ඍණ වේ.

(32) පහත සඳහන් දෑ අතුරින් වෙළඳපොළ අසාර්ථක වීමට හේතු නොවන්නේ,

(1) නිෂ්පාදනය සම්බන්ධයෙන් ඒකාධිකාරී වෙළඳපොළ රටාවක් පැවතීමයි.
(2) සමාජයේ අවගුණ භාණ්ඩ අධි නිෂ්පාදනයක් සිදු කිරීමයි.
(3) ආදායම් ව්‍යාප්තිය අසාධාරණ වීමයි.
(4) පෞද්ගලික භාණ්ඩ නිෂ්පාදනය වීමයි.
(5) බාහිරතා බිහිකරන භාණ්ඩ නිෂ්පාදනයේදී අහිමි වන ශුභ සාධනයක් (Dead - Weight loss) හට ගැනීමයි.

(33) කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය හා පරිභෝජනය පිළිබඳ වෙළෙඳපොල තොරතුරු පහත රූප සටහන පෙන්නුම් කරයි. ප්‍රස්තාර සටහනට අනුව, දැකගත හැකි වන්නේ,




(1) පරිභෝජනයේ ධන බාහිරතාවයක් සහ ඌණ පරිභෝජන තත්වයකි.
(2) පරිභෝජනයේ ඍණ බාහිරතාවය් සහ අධි පරිභෝජන තත්වයකි.
(3) නිෂ්පාදනයේ ධන බාහිරතාවක් සහ අධි නිෂ්පාදන තත්වයකි.
(4) නිෂ්පාදනයේ ඍණ බාහිරතා අවස්ථාවක් සහ ඌණ නිෂ්පාදන තත්වයකි.
(5) පරිභෝජනයේ ඍණ බාහිරතා අවස්ථාවක් සහ ඌණ නිෂ්පාදන තත්වයකි.

(34) වර්තමානයේ ශ්‍රී ලංකා රජයේ බදු සංයුතිය අනුව වැඩිම ආදායමක් ලබාදුන් බදු වර්ගයන් අනුපිළිවෙළට ඇතුළත් වන්නේ කුමන පිළිතුරෙහි ද?

(1) එකතු කළ අගය මත බදු, ආදායම් බදු සහ නිෂ්පාදන බදු
(2) ආදායම් බදු, නිෂ්පාදන / සුරා බදු සහ ජාතිය ගොඩනැගීමේ බද්ද
(3) නිෂ්පාදන / සුරාබදු ආනයන බදු සහ එකතු කළ අගය මත බදු
(4) ආනයන බදු, ආදායම් බදු සහ එකතු කළ අගය මත බදු
(5) ආදායම් බදු, එකතු කළ අගය මත බදු සහ නිෂ්පාදන / සුරා බදු.

(35) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ මධ්‍යම රජයේ නොපිය වූ ණය, දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් වශයෙන් කොපමණද?

(1) 100.2% (2) 103.8% (3) 108% (4) 114.2% (5) 103.9%

(36) සමජාතීය සම්පත් ප්‍රමාණයක් යොදාගනිමින් සමාන භාණ්ඩ වර්ග දෙකක් නිපදවන A සහ B යන රටවලට අදාළ නිෂ්පාදන හැකියා වක්‍ර පහත දැක්වේ.




එකඟ විය හැකි ප්‍රකාශය කුමක්ද?

(1) විදුලි පංකා නිෂ්පාදනයේ සාපේක්ෂ වාසිය B රටට හිමි වේ.

(2) A රට ජංගම දුරකථන සඳහා විශේෂීකරණය කළ යුතුය.

(3) ජංගම දුරකථන නිපදවීමෙහිලා කිසිදු රටකට නිරපේක්ෂ වාසියක් අත් නොවේ.

(4) ජංගම දුරකථන නිපදවීමේ නිරපේක්ෂ වාසිය A රටට හිමි වේ.

(5) විදුලි පංකා නිපදවීමෙහිලා සාපේක්ෂ වාසිය කිසිදු රටකට හිමි නොවේ.

(37) විදේශ වෙළෙඳාමේ ආරක්ෂණ වාදයට එරෙහිව ඉදිරිපත් වී ඇති කරුණ කුමක්ද?

(1) ළදරු කර්මාන්ත කාර්යක්ෂම හා තරඟකාරී වනතෙක් ආරක්ෂා කිරීම.

(2) ප්‍රපතනය වැළැක්වීම.

(3) වෙළෙඳ හිගය අඩුකර ගැනීම මගින් ගෙවුම් ශේෂය යහපත් කර ගැනීම.

(4) පාරිභෝගිකයන්ට වෙළෙඳපොළ තුළ තේරීමේ නිදහස සීමා වීම.

(5) රාජ්‍ය අයභාරයේ මූලාශ්‍රයක් වීම.

(38) ආදායම් වෙළෙඳ අනුපාතය තීරණය වීම කෙරේ බලනොපාන සාධකය කුමක්ද?

(1) අපනයන මිල

(2) අපනයන පරිමා දර්ශකය

(3) ආනයන මිල

(4) අපනයන ප්‍රමාණය

(5) ආනයන ප්‍රමාණය

(39) ශ්‍රී ලංකාවේ නාමික සඵල විනිමය අනුපාතය ප්‍රධාන මුදල් වර්ග 5 කට සාපේක්ෂව ද ගණනය කරනු ලබයි. ඊට ඇතුළත් නොවන මුදල් වර්ගය කුමක්ද?

(1) ඇමරිකානු ඩොලරය

(2) එංගලන්ත ස්ටර්ලින් පවුම්

(3) ජපන් යෙන්

(4) ජර්මන් ඩොයිෂ්මාර්ක්

(5) යූරෝ මුදල් ඒකකය

(40) 2022 වර්ෂයේදී ශ්‍රී ලංකාව වරණීය සහ නිදහස් වෙළෙඳ ගිවිසුම් යටතේ සිදුකළ අපනයන වටිනාකම තුළ වැඩිම අපනයන වටිනාකමක් ලැබූ වරණීය වෙළෙඳ ගිවිසුම වන්නේ මින් කුමක්ද?

(1) ආසියා - ශාන්තිකර වෙළෙඳ ගිවිසුම (APTA)

(2) ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (ISFTA)

(3) දකුණු ආසියානු වෙළෙඳ වරණය (SAFTA)

(4) පාකිස්තාන් - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (PSFTA)

(5) සාර්ක් වරණීය වෙළෙඳ ගිවිසුම (SAPTA)

(41) දේශීය වශයෙන් නිපදවා සැපයෙන භාණ්ඩයක් විදේශ වෙළෙඳ පොළෙන් ආනයනය කිරීම සහ තීරු බදු පැනවීමෙන් පසු පහත රූප සටහන මගින් දැක්වේ.




තීරු බදු පැනවීමෙන් පසු හටගෙන ඇති වෙනස්කම් නිවැරදිව විස්තර කෙරෙන්නේ පහත සඳහන් කවරක් මගින්ද?

| | රජයේ තීරුබදු ආදායම | අහිමි වූ ශුභ සාධනය | ආනයන පිරිවැය |
|---|---|---|---|
| (1) | G+H | F+I | G+H+M+N |
| (2) | E+F+G+H+I | C+D | L+M+N+O+P |
| (3) | G+H+M+N | E+F+I | C+D |
| (4) | G+H | K+ P | H+N+G+M |
| (5) | F+G+H+I | J+P | K+L+M+N+O+P |

(42) මෙයින් සාපේක්ෂ වාසි න්‍යායේ උපකල්පනයක් නොවන්නේ කුමක්ද?

(1) පූර්ණ සාධක සංචලතාව
(2) ස්ථාවර පරිමාණානුකූල ඵල
(3) දේශගුණයේ සුවිශේෂත්වය
(4) නිෂ්පාදනයේ හෝ පාරිභෝජනයේ බාහිරතා හට නොගන්නා බව
(5) ප්‍රවාහන පිරිවැය සැලකිල්ලට නොගැනීම.

(43) ආර්ථික වර්ධනය රටකට ඉතා වැදගත් හා තීරණාත්මක සාධකයකි. රටක් ආර්ථික වර්ධනයක් ලබා ගැනීමේදී ඇති වන වාසි මෙන් ම අවාසි ද තිබේ. එවැනි අවාසි අවස්ථාවකට නිදසුනකි.

(1) රැකියා අවස්ථා නිර්මාණය වීමෙන් ජීවන තත්වය ඉහළ යාම.
(2) ආදායම ඉහළ ගොස් ජීවන තත්වය උසස් වීම.
(3) ගෙවුම් ශේෂය ශක්තිමත් වීම.
(4) පරිසර හිතකාමී භාණ්ඩ නිෂ්පාදනයට යොමු වීමෙන් පරිසරය සුරක්ෂිත වීම.
(5) මුදලේ බාහිර අගය හෙවත් විදේශ අගය ශක්තිමත් නොවීම.

(44) පංචමක අපකිරණ අනුපාතය මනිනු ලබන නිවැරදි දර්ශකය කුමක්ද?

(1) පංචමක අපකිරණ අනුපාතය = $\frac{\text{ඉහළ ආදායම් ලබන පංතියට හිමි සාමාන්‍ය මාසික ආදායම}}{\text{මධ්‍යම ආදායම් ලබන පංතියට හිමි සාමාන්‍ය මාසික ආදායම}}$

(2) පංචමක අපකිරණ අනුපාතය = $\frac{\text{පහළ ආදායම් ලබන පංතියට හිමි සාමාන්‍ය මාසික ආදායම}}{\text{ඉහළ ආදායම් ලබන පංතියට හිමි සාමාන්‍ය මාසික ආදායම}}$

(3) පංචමක අපකිරණ අනුපාතය = $\frac{\text{ඉහළ ආදායම් ලබන පංතියට හිමි සාමාන්‍ය මාසික ආදායම}}{\text{පහළ ආදායම් ලබන පංතියට හිමි සාමාන්‍ය මාසික ආදායම}}$

(4) පංචමක අපකිරණ අනුපාතය = $\frac{\text{මධ්‍යම ආදායම් ලබන පංතියට හිමි සාමාන්‍ය මාසික ආදායම}}{\text{මැදි ආදායම් ලබන පංතියට හිමි සාමාන්‍ය මාසික ආදායම}}$

(5) පංචමක අපකිරණ අනුපාතය = $\frac{\text{ඉහළ ආදායම් ලබන පංතියට හිමි සාමාන්‍ය මාසික ආදායම}}{\text{පහළ මැදි ආදායම් ලබන පංතියට හිමි සාමාන්‍ය මාසික ආදායම}}$

(45) ශ්‍රී ලංකාවේ තුලිත ප්‍රාදේශීය සංවර්ධනය මැනීමේ මිනුමක් වශයෙන් 2008 වර්ෂයේ සෞභාග්‍යතා දර්ශකය හඳුන්වා දී ඇත. එම දර්ශකය අනුව ශ්‍රී ලංකාවේ වර්තමාන අගය කොපමණද?

(1) 0.700 (2) 0.770 (3) 0.796 (4) 0.790 (5) 0.800

(46) කිසියම් රටක් සංවර්ධනය අත්කර ගෙන ඇතැයි යන්න වඩාත් හොඳින් පෙන්නුම් කරනු ලබන්නේ කවර වෙනසක් මගින් ද?

(1) එම රටේ අයවැය ලේඛනය යහපත්වීමක්.
(2) එම රටේ පාරිසරික තිරසරභාවය ඉහළයාමක්.
(3) එම රටේ මුදල් සැපයුම වර්ධනයවීමක්.
(4) එම රටේ උද්ධමනය ඉහළයාමක්.
(5) එම රටේ ජනගහනය වැඩිවීමක්.

(47) 2022 වර්ෂයේ ශ්‍රී ලංකාවේ කෘෂි අංශය, කාර්මික අංශය සහ සේවා අංශය සේවා නියුක්තියට දැක්වූ සාපේක්ෂ දායකත්වය කොපමණ ද?

| අනු අංකය | කෘෂිකර්මය | කර්මාන්ත | සේවා |
|---|---|---|---|
| (1) | 20.3 % | 28.1 % | 51.6 % |
| (2) | 26.1 % | 25.5 % | 48.4 % |
| (3) | 26.1 % | 28.1 % | 45.9 % |
| (4) | 25.3 % | 27.6 % | 47.1% |
| (5) | 27.1 % | 26.9 % | 46.0 % |

(48) සමාජයේ ධනවත්ම 10% වෙතින් දිළිඳුතම 10% වෙත ආදායම් ප්‍රතිව්‍යාප්තියක් ඇති වුවහොත්,

(1) ජිනි සංගුණකය ඉහළ යන අතර ලෝරන්ස් වක්‍රය අංශක 45 රේඛාව මත පිහිටයි.

(2) ජිනි සංගුණකය ඉහළ යන අතර ලෝරන්ස් වක්‍රය අංශක 45 රේඛාවෙන් දුරස් වනු ඇත.

(3) ජිනි සංගුණකය පහළ යන අතර ලෝරන්ස් වක්‍රය අංශක 45 රේඛාවට සමීප වනු ඇත.

(4) ජිනි සංගුණකය පහළ යන අතර ලෝරන්ස් වක්‍රය අංශක 45 රේඛාවෙන් දුරස් වනු ඇත.

(5) ජිනි සංගුණකය ඉහළ යන අතර ලෝරන්ස් වක්‍රය අංශක 45 රේඛාව මත පතිතවනු ඇත.

(49) එක්තරා රටකට අදාළ ප්‍රජාවිද්‍යාත්මක දත්ත කිහිපයක් පහත දී ඇත.

| අයිතමය | සංඛ්‍යාව (මිලියන) |
|---|---|
| මුළු ජනගහනය | 32 |
| අවු: 15 ට අඩු ජනගහනය | 03 |
| වැඩ කළ හැකි වයසේ ජනගහනය | 27 |
| ආර්ථික වශයෙන් අක්‍රිය ජනගහනය | 02 |

මෙම රටෙහි සේවා වියුක්ති අනුපාතිකය 20% ක් නම්, ඉහත තොරතුරු ඇසුරෙන් වඩාත් නිවැරදි වන්නේ පහත සඳහන් කවර වරණය ද?

(1) ළමා යැපුම් අනුපාතිකය 9.37% ක් වන අතර ශ්‍රම බලකාය මිලියන 30 කි.

(2) සේවා වියුක්ති ජනගහනය මිලියන 08 ක් වන අතර, ආර්ථික වශයෙන් සක්‍රිය ජනගහනය මිලියන 29 කි.

(3) ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය 90% ක් වන අතර සේවා නියුක්ති ජනගහනය මිලියන 22 කි.

(4) සේවා වියුක්ති ජනගහනය මිලියන 05 ක් වන අතර ළමා යැපුම් අනුපාතිකය 11.11% කි.

(5) සේවා නියුක්ති ජනගහනය මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස 84.37 කි.

(50) ගෙවුණු වසර කිහිපය තුළ සිදු කළ ජාත්‍යන්තර ඇගයීම් ක්‍රියාවලියකදී ශ්‍රී ලංකාව, ''අළු ලැයිස්තුගත කිරීම'' ට ලක් වූ රටක් ලෙස නම් කෙරිණි. එසේ නම් කිරීමට හේතු වූයේ පහත දෑ අතරින් කවර කරුණක්ද?

(1) ගෝලීය මූල්‍ය පද්ධතිය තුළ සුරක්ෂිත මූල්‍ය පද්ධතියක පැවැත්ම තහවුරු කළ බැවිනි.

(2) මූල්‍ය අපරාධ වැළැක්වීමට පියවර ගත් බැවිනි.

(3) ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා කලාපීය වශයෙන් අවධානයක් යොමු කළ බැවිනි.

(4) දේශපාලන ස්ථාවර භාවය තහවුරු කිරීමට අපොහොසත් රටක් වූ බැවිනි.

(5) ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීම හා මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ ක්‍රමෝපායන්ගේ අඩුපාඩු සහිත රටක් වූ බැවිනි.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2024
Third Term Test - Grade 13 - 2024

විභාග අංකය: ....................................

# ආර්ථික විද්‍යාව - II

කාලය පැය 03 යි

(කියවීමට අමතර කාලය වි. 10 යි.)

උපදෙස්

- 'අ' උපකොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද, 'ආ' උපකොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## (''අ'' - උප කොටස)

01 (i) පහත සඳහන් දෑ කුමන ප්‍රාග්ධන ස්වරූපයකට අයත්දැයි ලියන්න.

(අ) ගොඩනැගිලි (ආ) මහා මාර්ග (ඉ) අර්ධ නිමි ද්‍රව්‍ය තොග

(ඊ) පාසල් පද්ධතිය (ලකුණු 04)

(ii) ''හිඟකම යනු දිළිඳුකමයි.'' මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වේද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) පහත සඳහන් සංසිද්ධි නිෂ්පාදන හැකියා මායිම් රූපසටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(අ) මාර්ග පද්ධතිය ඇතුළු ප්‍රවාහන පහසුකම් දියුණු වීම නිසා මෙතෙක් භාවිතයට නොගත් ග්‍රාමීය සම්පත් නිෂ්පාදනයට යොදා ගැනීම. (ලකුණු 02)

(ආ) පොහොර හිඟයක් නිසා කෘෂි ඵලදාව අඩු වීම. (ලකුණු 02)

(iv) හිඟ සම්පත් බෙදා වෙන්කිරීමේදී වෙළෙඳපොළ ආර්ථිකයක් විවිධ අකාර්යක්ෂමතා බිහි කරයි. වෙළෙඳපොළ ආර්ථකයක එවැනි අකාර්යක්ෂමතා 4 ක් ලියන්න. (ලකුණු 04)

(v) මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීමේදී එක් එක් ආර්ථික පද්ධතිවල කාර්ය සාධන මට්ටම් විවිධ වේ. මෙසේ වූ කාර්යසාධනය මැනීම සඳහා යොදා ගනු ලබන නිර්ණායක මොනවාද? (ලකුණු 04)

02 (i) භාණ්ඩයක් සඳහා වන සැපයුම හා සැපයුම් ප්‍රමාණය අතර වෙනස කුමක්ද? රූප සටහන් මගින් එම වෙනස පෙන්වා දෙන්න. (ලකුණු 04)

(ii) මිල ප්‍රතිවිපාකයට බලපාන මිල වෙනස්වීමක ආදේශන ප්‍රතිවිපාකය යනු සලකා බලන භාණ්ඩයේ <u>සාපේක්ෂ මිල</u> වෙනසකට එහි ඉල්ලුම් ප්‍රමාණය දක්වන ප්‍රතිචාරයයි. මෙහි ''සාපේක්ෂ මිල'' යන්න අර්ථ දක්වන්න. (ලකුණු 02)

(iii) (අ) x භාණ්ඩයේ මිල රු. 10 දී y භාණ්ඩයේ ඉල්ලුම ඒකක 100 කි. x භාණ්ඩයේ මිල රු. 15 දී y භාණ්ඩයේ ඉල්ලුම ඒකක 200 කි. x භාණ්ඩයේ මිල රු. 10 දී y භාණ්ඩයේ හරස් මිල ඉල්ලුම් නම්‍යතාව ගණනය කරන්න. (ලකුණු 02)

(ආ) හරස් ඉල්ලුම් නම්‍යතා සංගුණකයේ අගය අනුව මෙම භාණ්ඩ යුගලය කුමන වර්ගයකට අයත්වේද? (ලකුණු 02)

(iv) පහත සඳහන් එක් එක් සිදුවීම් සෙවිලි තහඩු වෙළෙඳපොළ සැපයුම් වක්‍රයටත්, සමතුලිතයටත් ඇතිකෙරෙන බලපෑම පැහැදිලි කරන්න.

(අ) සෙවිලි තහඩු නිෂ්පාදනයට යොදා ගැනෙන අමුද්‍රව්‍ය මිල ගණන් ඉහළයාම. (ලකුණු 02)

(ආ) සෙවිලි තහඩු නිෂ්පාදන කර්මාන්තයට අලුත් ආයතන ප්‍රවේශ වීම. (ලකුණු 02)

(v) එක්තරා භාණ්ඩයකට අදාළ සරල රේඛීය ඉල්ලුම් සැපයුම් සමීකරණ පහත දැක්වේ.

$Qd = 60 - 2p$ (අ) වෙළෙඳපොළ සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 02)

$Qs = -30 + 4p$ (ආ) සමතුලිත මිලේදී සැ. නම්‍යතාව ගණනය කරන්න. (ලකුණු 02)

(ඉ) මිල රු. 10 දී අධි ඉල්ලුම් ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 02)

03 (i) නිෂ්පාදන සහනාධාරයකට පසු හටගන්නා වෙළඳපොළ සමතුලිත නිමැවුම පාරිභෝගික හා නිෂ්පාදක අතිරික්තයන් ඉහළ නංවන බැවින් නිෂ්පාදන සහනාධාරයෙන් පසු නිමැවුම, කාර්යක්ෂම වේ. මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේද? නැද්ද? හේතු සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) තරගකාරී වෙළෙඳපොළක අලෙවි කරන ඩීසල් අතිශය අත්‍යවශ්‍ය භාණ්ඩයක් වේ යැයි සිතන්න. තවද නම්‍ය සැපයුමක් පවත්නා මෙම භාණ්ඩය මත විශේෂිත නිෂ්පාදන බද්දක් පනවනු ලැබුවහොත්, බදු අපාතය බෙදී යන ආකාරය රූප සටහනකින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) නිදහස් වෙළඳපොළක අලෙවිවන භාණ්ඩයකට අදාළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත සමීකරණ නිරූපණය කරයි.

$$Qd = 320 - 3p$$
$$Qs = -80 + 2p$$

(අ) මෙම වෙළඳපොළට රජය මැදිහත්වී මෙම භාණ්ඩය විකිණිය හැකි උපරිම මිල රුපියල් 60 ක් ලෙස පාලන මිලක් ප්‍රකාශයට පත් කරන්නේ යැයි සලකන්න. උපරිම මිල නියම කිරීමෙන් පසු හටගන්නා අධි ඉල්ලුම රූප සටහනකින් පෙන්නුම් කරන්න. (ලකුණු 04)

(ආ) හිඟ භාණ්ඩ සලාකනය සඳහා කලුකඩ මිල ක්‍රියාත්මක වන්නේ නම් උපරිම කලුකඩ මිල කොපමණද? (ලකුණු 02)

(ඉ) මෙම භාණ්ඩය වෙළෙඳපොළේ පාලන මිලට අලෙවි වේයැයි උපකල්පනය කරන්න. මිල පාලනය හේතුවෙන් හටගන්නා අහිමි ශුභසාධනයේ ප්‍රමාණය (Dead-Weight loss) ඉහත ප්‍රස්තාර සටහනෙහි පෙන්නුම් කරන්න. (ලකුණු 02)

(iv) ''රජය විසින් ඇතැම් සුවිශේෂි භාණ්ඩ හා සේවා සඳහා අවම මිලක් නියම කරනුයේ වෙළඳපොළේ තීරණය වී ඇති සමතුලිත මිල නිෂ්පාදකයාට අසාධාරණ මිලක් ලෙස සලකා ඔවුන්ට ඉහළ මිලක් ලබාදීමේ අපේක්ෂාවෙනි.'' අවම මිල ප්‍රතිපත්තියක් හඳුන්වාදීමෙන් පසු, වෙළෙඳපොළ තුළ ඌණ නිෂ්පාදන තත්ත්වයක් හටගතහොත් සමස්ත ආර්ථික අතිරික්තයට ඇති කෙරෙන බලපෑම රූප සටහනකින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

04 (i) කෙටි කාලීන පිරිවැය සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන බව දක්වන්න.

(අ) සාමාන්‍ය මුළු පිරිවැය සහ සාමාන්‍ය විචල්‍ය පිරිවැය අතර පරතරය ආන්තික පිරිවැය වේ.

(ආ) ආන්තික පිරිවැය වක්‍රය සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයේ අවම ලක්ෂය ඡේදනය කරයි.

(ඇ) නිමැවුම වැඩිවත්ම සාමාන්‍ය මුළු පිරිවැය හා සාමාන්‍ය විචල්‍ය පිරිවැය අතර පරතරය පටු වේ.

(ඉ) ආන්තික පිරිවැය වක්‍රය සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රයේ අවම ලක්ෂ්‍යය ඡේදනය කරයි.

(ලකුණු 02)

(ii) ව්‍යාපාරිකයෙක් විශාල ප්‍රාග්ධන උපකරණ තොගයක් යොදවමින් නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යනබව සිතන්න. එම ප්‍රාග්ධන තොගයේ වටිනාකම අනුව වාර්ෂිකව ප්‍රතිසම්පාදනය සඳහා ද කිසියම් මුදලක් වෙන්කරනු ලබයි. ඔහුගේ ව්‍යාපාරයේ මුදල් වර්ෂය ආරම්භයේදී තිබූ තම ප්‍රාග්ධන උපකරණ තොගයේ අලෙවි වටිනාකම වසර අවසානයේදී අඩු වී තිබුණි.
මෙම තොරතුරු ආශ්‍රයෙන් ''ක්‍රම ක්ෂය ගාස්තු'' හා ''ආර්ථික ක්ෂය වීම'' යන සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) පහත දැක්වෙන්නේ පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක් වර්තමානයේ කටයුතු කරන ආකාරයකි. එම ආයතනයේ මුළු ස්ථාවර පිරිවැය රු. 20000/- වේ.




කෙටි කාලයේදී මෙම ආයතනය ලාභ උපරිම කිරීමට හෝ අලාභ අවම කිරීමට හෝ කුමක් කළ යුතුද? හේතු සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iv) දිගු කාලයේදී නිෂ්පාදන ධාරිතාව ප්‍රසාරණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් නිෂ්පාදන ආයතනයක හට ගන්නා පරිමාණානුකූල පිරිවැසුම් හා පරිමාණානුකූල නොපිරිමැසුම් පැහැදිලි කරන්න. (ල.02)

(v) ඒකාකාරී වෙළෙඳපොළ ව්‍යුහයක කැපී පෙනෙන ලක්ෂණ 4 ක් දක්වන්න. (ලකුණු 04)

(vi) රතුළුණු වෙළෙඳපොළ මිල කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 200 කි. එක්තරා ළූණු ගොවියෙක් සතියකදී කිලෝ 30 ක් අලෙවි කරයි.
ඒ සඳහා ඔහුගේ කිලෝ ග්රෑමයක් සඳහා සාමාන්‍ය විචල්‍ය පිරිවැය හා සාමාන්‍ය ස්ථාවර පිරිවැය පිළිවෙලින් රුපියල් 120 හා රුපියල් 70 ක් වේ.
සතියකදී ළූණු ගොවියාගේ නිෂ්පාදක අතිරික්තය හා ආර්ථික ලාභය ගණනය කරන්න.(ලකුණු 04)

05 (i) ''රජය, ලාභ අපේක්ෂාවක් නොමැති කුටුම්භ සඳහා සේවා සපයන ආයතන, කුටුම්භ අංශය යන ආයතන ලාභ අපේක්ෂාවෙන් තොරව නිපදවනු ලබන, ඒ හේතු කරගෙන වෙළඳපොළ තුළ අලෙවි නොවන, භාණ්ඩ හා සේවා ද නිෂ්පාදන ඉමට ඇතුළත් වේ.'' එම භාණ්ඩ හා සේවාවල නිමැවුම ඇස්තමේන්තු කිරීමේදී සැලකිල්ලට ගනු ලබන්නේ ඒවායේ මුළු නිෂ්පාදන පිරිවැයයි. එම සමස්ත නිෂ්පාදන පිරිවැය තුළට ඇතුළත්වන ප්‍රධාන සංරචක කවරේද? (ලකුණු 04)

(ii) දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයට අයත් නිෂ්පාදනය කරන ලද මූල්‍ය නොවන වත්කම් හා නිෂ්පාදනය නොකළ මූල්‍ය නොවන වත්කම් හඳුන්වන්න. (ලකුණු 02)

(iii) එක්තරා කල්පිත ආර්ථිකයක් පිළිබඳ පහත දත්ත ඔබ වෙත දී ඇතැයි සලකන්න. (සියලුම සංඛ්‍යා රුපියල් බිලියන වලිනි.)

| අයිතමය | වටිනාකම | අයිතමය | වටිනාකම |
|---|---|---|---|
| සේවක ආදායම් | 2400 | නිෂ්පාදිතය මත සහනාධාර | 250 |
| දළ මිශ්‍ර ආදායම් | 3800 | දළ දේශීය නිෂ්පාදනය | 11000 |
| දළ මෙහෙයුම් අතිරික්තය | 4000 | ශුද්ධ අපනයන | - 100 |
| නිෂ්පාදිතය මත බදු | 900 | ගෙවුම් තුලන ලේඛනයේ ජංගම ගිණුම (ශුද්ධ) | 200 |

ඉහත තොරතුරු ඇසුරින් සඳහන් දෑ ගණනය කරන්න.

(අ) මූලික මිල යටතේ දළ එකතු කළ අගය (ලකුණු 02)
(ආ) විදේශීය ඉතුරුම් (ලකුණු 02)
(ආ) වැය කළ හැකි දළ ජාතික ආදායම (ලකුණු 02)

(iv) (අ) විවෘත ආර්ථිකයකට අදාළ සමාහාර වියදම් ශ්‍රිතය මගින් පෙන්නුම් කරන්නේ කුමක්ද? (ලකුණු 02)
(ආ) රූප සටහනකින් සමාහාර වියදම් ශ්‍රිතය පෙන්නුම් කර ජාතික ආදායමේ සමතුලිත මට්ටම එහි දක්වන්න. (ලකුණු 02)

(v) කල්පිත සමතුලිත ආර්ථිකයකට අදාළ සාර්ව ආර්ථික දත්ත කිහිපයක් පහත දැක්වේ. (සියලුම සංඛ්‍යා රුපියල් බිලියන වලිනි.)

පරිභෝජනය (C) $= 50 + 0.8\,Yd$
ආයෝජනය (I) $= 120$
රජයේ වියදම් (G) $= 200$
ස්වායත්ත බදු (T) $= 80$
ආණ්ඩුවෙන් කුටුම්භ වෙත ලබාදෙන සංක්‍රාම (Tr) $= 55$
ශුද්ධ අපනයන (NX) $= -100$

(අ) මෙම ආර්ථිකයේ වැය කළ හැකි පෞද්ගලික ආදායම ගණනය කරන්න. (ලකුණු 02)
(ආ) මෙම ආර්ථිකයේ පවත්නා සමතුලිත ජාතික ආදායම් මට්ටම රුපියල් බිලියන 500 ක ධන නිමැවුම් පරතරයක් බිහිකර ඇතැයි සලකන්න. එම නිමැවුම් පරතරය ඉවත් කර ගැනීමට විකල්ප ක්‍රියාමාර්ගයක් වශයෙන් රාජ්‍ය වියදම් භාවිත කරයි නම් රාජ්‍ය වියදම් කොපමණ ප්‍රමාණයකින් වෙනස් කළ යුතුද? (ලකුණු 02)

**(''ආ'') උප කොටස**

- **මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න <u>දෙකක්</u> තෝරා ගන්න.**

06 (i) වත්කම් වශයෙන් සලකන සියලු දෑ මුදල් ලෙස සැලකිය නොහැකි වන්නේ මුදල් වෙනත් වත්කම් වලින් වෙන්කර හඳුනාගත හැක් සුවිශේෂී ලක්ෂණ නිසාය. හොඳ මුදලක ලක්ෂණ දක්වන්න.(ල.04)

(ii) ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ගණනය කිරීමේදී සැලකිල්ලට ගනු ලබන සංරචක දක්වන්න. (ලකුණු 04)

(iii) පහත සඳහන් දෑ කෙරෙහි උද්ධමනය බලපාන්නේ කෙසේද?

(අ) සේවා වියුක්තිය (ආ) විනිමය අනුපාතය
(ඉ) ආනයන (ඊ) ගෙවුම් ශේෂය (ලකුණු 04)

(iv) එක්තරා ආර්ථිකයක බැංකු පද්ධතිය සම්බන්ද තොරතුරු පහත දැක්වේ. (සියලුම සංඛ්‍යා රුපියල් මිලියන වලිනි.)

| | |
|---|---|
| ප්‍රාග්ධනය | 100 |
| මුදල් හා සංචිත | 200 |
| ණය | 900 |
| තැන්පතු | 1000 |

ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 20%

ඉහත තොරතුරු භාවිත කරමින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i) බැංකු පද්ධතියේ වත්කම් හා වගකීම් දැක්වීම සඳහා ශේෂ පත්‍රයක් පිළියෙල කරන්න. (ල.01)

ii) බැංකු පද්ධතිය සතුව අතිරික්ත සංචිත පවතීද? (ලකුණු 01)

iii) බැංකු පද්ධතියට තවදුරටත් තැන්පතු නිර්මාණය කළ හැකිද? (ලකුණු 01)

iv) ඉහත බැංකු පද්ධතිය සපයා ඇති ණය ප්‍රමාණය 700 ක් වූයේ නම් එහි ශේෂ පත්‍රය කුමන ආකාරයට වෙනස් වේද ? (ලකුණු 01)

v) සපයා ඇති ණය ප්‍රමාණය 700 වන විට අතිරික්ත සංචිතවල වටිනාකම කොපමණද? (ලකුණු 01)

vi) අතිරික්ත සංචිත සම්පූර්ණයෙන් ණයදීම සඳහා භාවිත කරන්නේ නම් බැංකු පද්ධතියට නිර්මාණය කළ හැකි නව තැන්පතු ප්‍රමාණය කොපමණද? (ලකුණු 01)

vii) අතිරික්ත සංචිතය සම්පූර්ණයෙන් ණය දීම සඳහා භාවිතා කළවිට බැංකු පද්ධතියේ නව ශේෂ පත්‍රය දක්වන්න. (ලකුණු 02)

07 (i) පහත දැක්වෙන එක් එක් අවස්ථාවන්හි ගම්‍ය වන බාහිරතා ස්වරූපය කවරේද?

(අ) වෙළෙඳපොළ ආර්ථිකයේ පෞද්ගලික නිෂ්පාදකයා විසින් ඒකක 80000 ක් නිපදවන අතර එම ආර්ථිකයේ සමාජීය වශයෙන් බලපොරොත්තු වන නිමවුම 50000 කි.

(ආ) වෙළඳපොළ ආර්ථිකයක පෞද්ගලික පරිභෝජනය ඒකක 1000 කි. නමුත් සමාජීය වශයෙන් අවශ්‍ය කරන පරිභෝජනය ඒකක 900 කි.

(ඇ) වෙළඳපොළ ආර්ථිකය පෞද්ගලික නිෂ්පාදකයා විසින් ඒකක 4000 ක් නිපදවා තිබෙන අතර එම ආර්ථිකයේ සමාජීය වශයෙන් බලාපොරොත්තු වන නිමවුම ඒකක 5000 කි.

(ඉ) සමාජීය වශයෙන් බලාපොරොත්තු වන ප්‍රශස්ත පාරිභෝජනය ඒකක 8000 කි. නමුත් වෙළෙඳපොළ ආර්ථිකයක පවතින පරිභෝජනය ඒකක 7000 කි. (ලකුණු 04)

(ii) පහත සඳහන් දෑ ශුභ සාධන භාණ්ඩ ද ශුද්ධ පොදු භාණ්ඩ ද අර්ධ පොදු භාණ්ඩ ද පොදු සම්පත් ද යන්න දක්වන්න.

(අ) අධිවේගී මාර්ග (ආ) පරිසර ආරක්ෂණ වැඩ සටහන්

(ඇ) සනීපාරක්ෂක සේවා (ඉ) පොදු තෘණ බිම් (ලකුණු 04)

(iii) (අ) රාජ්‍ය සැපයුම් පාර්ශ්වයේ ප්‍රතිපත්තියක් වශයෙන් නියාමනහරණය යන්න හඳුන්වන්න. (ලකුණු 02)

(ආ) එවැනි නියාමනහරණයක වාසි මොනවාද? (ලකුණු 04)

(iv) රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව සඳහා රජය විසින් දක්වන කැපවීම පිළඹිබු කරමින් මෑත වර්ෂවල දී රජයේ ආදායම දළ දේශීය නිෂ්පාදනයෙහි ප්‍රතිශතයක් ලෙස සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. එවැනි වර්ධනයකට බලපාන ලද හේතු කවරේද? (ලකුණු 06)

08 (i) පහත සංකල්ප පැහැදිලි කරන්න.

(අ) ස්ථිතික වාසි

(ආ) ගතික වාසි

(ඉ) තරඟකාරීත්ව වාසි (ලකුණු 03)

(ii) සඵල ආරක්ෂණය යනු කුමක්දැයි ලියා දක්වා එය ගණනය කරන සූත්‍රයේ සංරචක ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) තීරුබදු නොවන ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග 04 ක් දක්වන්න. (ලකුණු 04)

(iv) ආර්ථික ඒකාබද්ධ වීම යනු කුමක්දැයි දක්වා එහි ස්වරූප 04 ක් දක්වන්න. (ලකුණු 05)

(v) පහත දැක්වෙන්නේ කිසියම් වර්ෂයක ශ්‍රී ලංකා ආර්ථිකයේ ගෙවුම් ශේෂ ලේඛනයට අදාළ කල්පිත දත්ත කිහිපයකි. සියලු සංඛ්‍යා රුපියල් දශලක්ෂවලිනි.

| | |
|---|---|
| අපනයන වටිනාකම | 274,000 |
| සේවා ලැබීම් | 51,000 |
| සේවා ගෙවීම් | 42,000 |
| ආදායම් ශුද්ධ | - 9,000 |
| පෞද්ගලික සංක්‍රාම ශුද්ධ | 46,000 |
| නිල සංක්‍රාම ශුද්ධ | 2,000 |
| ජංගම ගිණුමේ ශේෂය | - 22,000 |

අදාළ දත්ත පදනම් කරගෙන පහත දෑ ගණනය කරන්න.

i) වෙළෙඳ ශේෂය (ලකුණු 01)

ii) ආනයන වටිනාකම (ලකුණු 01)

iii) භාණ්ඩ සේවා ආදායම් ශුද්ධ ශේෂය (ලකුණු 01)

iv) දළ දේශීය වියදම රුපියල් 350,000 නම් දළ දේශීය නිෂ්පාදිත වියදම ගණනය කරන්න. (ල.01)

09 (i) මෑත කාලීන ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය සෘණ අගයක් වාර්තාවීම ඉතා ඛේදනීය තත්ත්වයකි. මෙවැනි සෘණ ආර්ථික වෘද්ධියක් පැවතීමෙන් රටකට ඇතිවිය හැකි අහිතකර ප්‍රතිවිපාක කවරේද? (ලකුණු 04)

(ii) එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධව ක්‍රියාත්මක වන එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන මගින් හඳුන්වා දුන් මානව සංවර්ධන දර්ශකය අනුව ලෝකයේ රටවල් වර්ගීකරණය කරන්නේ කෙසේද? (ලකුණු 04)

(iii) ලෝකයේ රටවල් වර්තමානය වන විට තිරසර සංවර්ධනය ගැන වැඩි වශයෙන් අදහස් දක්වයි. තිරසර සංවර්ධනයක් යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි යන්න පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iv) වර්තමාන ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව ඉහළ මට්ටමක පවතින බව සමාජ ආර්ථික සමීක්ෂණ වාර්තා පෙන්වා දෙයි. එමගින් දිලිඳු ජන කොටස් දැඩි පීඩනයකට පත් ව ඇති බැවින් සමාජ ආර්ථික ගැටලු රැසක් නිර්මාණය වෙමින් පවතී. රජයකට දිළිඳු ජන කොටස්වල ජීවන තත්ත්වය උසස් කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කරන්න. (ලකුණු 04)

(v) පසුගිය දශක කිහිපයක ශ්‍රී ලංකාවේ ජනගහන ව්‍යාප්තියේ සැලකිය යුතු වෙනස්කම් රාශියක් සිදු වී ඇත. එවැනි වෙනස්කම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

10 (i) (අ) ''යටිතල පහසුකම්'' නිර්වචනය කොට, ආර්ථික යටිතල පහසුකම්වල ස්වරූප දක්වන්න. (ලකුණු 02)

(ආ) ආර්ථික අර්බුධය හමුවේ අවදානමට ලක්විය හැකි කුටුම්බවලට සහන සැලසීමේ අරමුණින් 2023 වර්ෂයේ ආරම්භ කරන ලද ''අස්වැසුම'' වැඩසටහනේ වත්මන් කාර්ය සාධනය සැකෙවින් සාකච්ජා කරන්න. (ලකුණු 03)

(ii) ''පසුගිය කාල පරිච්ඡේදය තුළ ආර්ථිකයේ ඇති වූ ගැටළුකාරී තත්ත්වය හේතුවෙන් වයස අවුරුදු 3 ත් 21 ත් අතර පුද්ගලයන් 54.9% කගේ පාසැල් අධ්‍යාපනය කෙරෙහි බලපෑම් ඇති වී ඇති බව ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සිදුකළ සමීක්ෂණයකින් හෙළි වී තිබේ.'' මෙම තත්ත්වයට බලපෑ හේතු දක්වමින්, ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා ප්‍රවේශය සහ සහභාගීත්වය වැඩි දියුණු කිරීමේ අරමුණින් රජය ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේදැයි සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) ''ආර්ථිකය විවිධාංගීකරණය කිරීමේ පදනම සැපයීමට සෘජු විදේශ ආයෝජන අත්‍යවශ්‍ය සාධකයක් වන අතර, ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රගතිය අසතුටුදායක මට්ටමක පවතී.'' මෙම තත්ත්වයට හේතු විය හැකි යැයි සැලකෙන දේශපාලනික අවදානම් තත්ව කවරේද? (ලකුණු 04)

(iv) ''පෙර වර්ෂයට සාපේක්ෂව වසරේ අවසාන කාල පරිච්ඡේදයේ දී විවිධ අංශවල ධනාත්මක වර්ධනයක් ඇති කරමින් ශ්‍රී ලංකාවේ විදේශීය අංශය, 2023 වසරේදී ශක්තිමත් ලෙස යථා තත්වයට පත්වෙමින් ඉහළ ස්ථාවරත්වයක් පෙන්නුම් කරන ලදී. එම තත්වයට බලපෑ හේතු සඳහන් කරන්න. (ලකුණු 04)

(v) වර්තමානයේ පවතින ගෝලීය ආර්ථික පරිසරය තුළ මතු වී ඇති අහිතකර ගෝලීය ප්‍රවණතා ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි කෙබඳු බලපෑමක් ඇති කරන්නේ ද? (ලකුණු 03)

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved



# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2024
## ආර්ථික විද්‍යාව

**13 ශ්‍රේණිය** **I කොටස** **පිළිතුරු පත්‍රය**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 - (2) | 2 - (2) | 3 - (5) | 4 - (5) | 5 - (5) | 6 - (3) | 7 - (2) | 8 - (4) | 9 - (2) | 10 - (4) |
| 11 - (1) | 12 - (4) | 13 - (1) | 14 - (3) | 15 - (4) | 16 - (3) | 17 - (5) | 18 - (4) | 19 - (3) | 20 - (4) |
| 21 - (5) | 22 - (3) | 23 - (2) | 24 - (2) | 25 - (4) | 26 - (3) | 27 - (1) | 28 - (3) | 29 - (2) | 30 - (3) |
| 31 - (4) | 32 - (4) | 33 - (2) | 34 - (5) | 35 - (4) | 36 - (3) | 37 - (4) | 38 - (5) | 39 - (4) | 40 - (2) |
| 41 - (1) | 42 - (3) | 43 - (5) | 44 - (3) | 45 - (3) | 46 - (2) | 47 - (2) | 48 - (3) | 49 - (4) | 50 - (5) |

## II කොටස

01 (i) (අ) ගොඩනැගිලි - ස්ථාවර ප්‍රාග්ධනය

(ආ) මහා මාර්ග - ආර්ථික පොදු කාර්ය ප්‍රාග්ධනය

(ඉ) අර්ධ නිමි ද්‍රව්‍ය තොග - කාරක / සංසරණ / පරිලේඛන ප්‍රාග්ධනය

(ඊ) පාසල් පද්ධතිය - සමාජ පොදු කාර්ය ප්‍රාග්ධනය (ල. 04)

(ii) එකඟ නොවේ.

හිගකම යනු අසීමිත මිනිස් වුවමනා සපුරා ගැනීමට ආර්ථිකය සතු සම්පත් ප්‍රමාණවත් නොවීමයි. එහෙත් දිළිඳුකම යනු පුද්ගලයාට අවම ජීවන මට්ටමක් පවත්වාගෙන යාමට ප්‍රමාණවත් ආදායමක් නොලැබීමයි. (ල. 02)

ඒ අනුව හිඟකම යන ගැටළුව සමාජයේ වෙසෙන දිළිඳු පුද්ගලයෙකුට වුවද ධනවතෙකුට වුවද එක සේ මුහුණ දීමට සිදුවන පොදු ගැටළුවකි.

ලෝකයේ දිළිඳු රටවල් මෙන්ම ධනවත් රටවල් ද එක සේ මෙම ගැටළුවට මුහුණ දෙයි. ලෝකයේ ධනවත්ම පුද්ගලයාට වුවද සම්පත් පිළිබඳ හිගකමක් පවතී. ඔහුට කාලය ඉතා සීමිත සම්පතකි. ඉතා විශාල මුදල් සම්භාරයක් හිමිකරගත් ඔහුට ඒවා වියදම් කිරීමට ඇත්තේ දිනකට පැය 24 ක් පමණි. (ල. 01)

එබැවින් හිගකම යනු දිළිඳුකම නොවේ. දිළිඳුකම තුරන් කළ හැකි වුවත් අසීමිත මිනිස් වුවමනා පවතින තාක්කල් හිගකම තුරන් කළ නොහැකි ගැටළුවකි. (ල. 1)

(iii) (අ) මාර්ග පද්ධතිය දියුණු වීම නිසා මෙතෙක් භාවිතයට නොගත් ග්‍රාමීය සම්පත් නිෂ්පාදනයට යොදා ගැනීම. මෙහිදී මෙතෙක් භාවිතයට නොගත් සම්පත් භාවිතයට ගැනීම යනු සම්පත් උපයෝජනය ඉහළ යාමකි. නැතහොත් සේවා වියුක්ති සම්පත් උපයෝජනය කිරීමයි. එවිට නිෂ්පාදන හැ. මායිම ඇතුළත පිහිටි ලක්ෂ්‍ය මායිම දෙසට විතැන් වේ. ( A සිට B දක්වා) (ල. 01)



(ල. 1)

(ආ) පොහොර හිඟයක් නිසා කෘෂි ඵලදාව අඩු වීම.

(ල. 1)




හෝ




(ල. 1)

කෘෂි අංශයේ ඵලදායිතාව අඩුවන නිසා කෘෂි අංශයෙන් පමණක් වමට විතැන් වේ.

කෘෂි ඵලදායිතාව අඩු වීම නිසා සම්පූර්ණ නි.හැ. වක්‍රය වමට විතැන් වේ. (මෙහිදී නි.හැ.මා වක්‍රයේ අක්ෂ දෙක කෘෂි භාණ්ඩ 2 ක් සඳහන් විය යුතුය.)

(iv) - ආදායම් ව්‍යාප්ති විෂමතා - පොදු භාණ්ඩ නොසැපයීම, ශුභ සාධන භාණ්ඩ ප්‍රමාණවත්ව නොසැපයීම. - බාහිරතා පිළිබඳ සැලකිලිමත් නොවීම. - සාධාරණත්වය නොමැති වීම. - ස්වාර්ථය මත වූ සානුබල ක්‍රියාත්මක වීම නිසා පොදු යහපත පිළිබඳ සැලකිල්ලක් නොදැක්වීම. - ස්වභාවික සම්පත් අධි උපයෝජනයට ලක් කිරීම. (කරුණු 4 ට ල. 04)

(v) - පූර්ණ සේවා නියුක්තිය - ආර්ථික කාර්යක්ෂමතාව - ආර්ථික වෘද්ධිය - මිල ස්ථායිතාව - සාධාරණ ආදායම් ව්‍යාප්තිය - බාහිර ස්ථායිතාව - පාරිසරික ගුණාත්මකභාවය - ආර්ථික නිදහස (ල. 04)

02 (i) නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ සැපයුමට බලපාන අනෙකුත් සාධක ස්ථාවරව තිබියදී සලකා බලන භාණ්ඩයට ඇති විවිධ මිල ගණන් යටතේ සැපයුම්කරුවන් විසින් සැපයීයට කැමති හැකියාව ඇති සැපයීමට සූදානම් විවිධ ප්‍රමාණයන් සැපයුම ලෙස හැඳින්වේ. (ල. 01)

සැපයුම් ප්‍රමාණය යනු නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ සැපයුමට බලපාන මිල හැර අනෙකුත් සාධක ස්ථාවරව තිබියදී සලකා බලන භාණ්ඩයට ඇති නිශ්චිත මිලක් යටතේ සැපයුම්කරුවන් විසින් සැපයීමට කැමති, හැකියාව ඇති, සූදනම් වන භාණ්ඩ ප්‍රමාණයයි. (ල. 01)

සැපයුම සමස්ත සැපයුම් වක්‍රයෙන්ම පෙන්නුම් කරන අතර සැපයුම් ප්‍රමාණය සැපයුම් වක්‍රයේ එක් ලක්ෂ්‍යයකින් පෙන්නුම් කරයි. (A ලක්ෂ්‍යය)







(ලකුණු 02)

(ii) නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ ඉල්ලුම කෙරෙහි බලපාන මිල හැර අනෙකුත් සාධක ස්ථාවරව තිබියදී සලකා බලන භාණ්ඩයේ මිල වෙනස්වන විට එහි සාපේක්ෂ මිල වෙනස් වේ.

''සාපේක්ෂ මිල'' යනු සලකා බලන භාණ්ඩයට ඇති ආදේශක භාණ්ඩයක මිලට සාපේක්ෂව සලකා බලන භාණ්ඩයේ මිලයි. (ලකුණු 02)

(iii) (අ) හරස් මිල ඉල්ලුම් නම්‍යතාව (CED)

$$= \frac{\Delta Qdy}{\Delta Px} \times \frac{Px}{Qdy}$$

$$= \frac{\cancel{100}}{\cancel{5}} \times \frac{\cancel{10}^{2}}{\cancel{100}} = 2$$

(ලකුණු 02)

(ආ) හරස් ඉල්ලුම් නම්‍යතා සංගුණකය +2 වේ. එබැවින් මෙම භාණ්ඩ යුගලය ආදේශක භාණ්ඩ වේ. (ලකුණු 02)

(iv) (අ) සෙවිලි තහඩු අමුද්‍රව්‍ය මිල ගණන් ඉහළ යාම.




අමුද්‍රව්‍ය මිල ගණන් ඉහළ යාම නිසා සෙවිලි තහඩු නිෂ්පාදනයේ සැපයුම අඩු වේ. එබැවින් සැපයුම් වක්‍රය වමට විතැන් වීම නිසා සමතුලිත මිල වැඩි වී අලෙවි ප්‍රමාණය පෙරට වඩා අඩු වේ. (රූපසටහන අවශ්‍යම නැත.) (ලකුණු 02)

(ආ) සෙවිලි තහඩු නිෂ්පාදන කර්මාන්තයට අලුත් ආයතන පැමිණීම නිසා සෙවිලි තහඩු සැපයුම් ආයතන සංඛ්‍යාව වැඩි වේ. එවිට සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ.




සමතුලිත මිල අඩු වේ. ස. අලෙවි ප්‍රමාණය වැඩි වේ. (ලකුණු 02)

(v) (අ)

$$Qd = QS$$
$$60 - 2P = -30 + 4P$$
$$60 + 30 = 4P + 2P$$
$$90 = 6P$$
$$\frac{90}{6} = \frac{6P}{6}$$

සම. මිල $\underline{\underline{15 = P}}$ (ලකුණු 01)

සමතුලිත ප්‍රමාණය $Qd = 60 - 2P$

$$= 60 - 2(15)$$
$$= 60 - 30$$

= 30 ඒකක (ලකුණු 01)

(ආ)

$$PES = \frac{\Delta Qs}{\Delta P} \times \frac{P}{Qs}$$
$$= 4 \times \frac{15^{1}}{30_{2}}$$ (ලකුණු 01)
$$= 4^{2} \times \frac{1}{2}$$

සැ. නම්‍යතාව = 2 (ලකුණු 01)

(ඉ) අධි ඉල්ලුම් ප්‍රමාණය සෙවීම.

රු. 10 දී Qd

$Qd = 60 - 2P$

$Qd = 60 - 2(10)$

$= 60 - 20$

$Qd = 40$

රු. 10 දී Qs

$Qs = -30 + 4P$

$Qs = -30 + 4(10)$

$= -30 + 40$

$Qs = 10$

රු. 10 දී අධි ඉල්ලුම් ප්‍රමාණය

Qd - Qs (රු. 10 ඉල්ලුම් ප්‍රමාණය - රු. 10 දී සැපයුම් ප්‍රමාණය)

40 -10

30 ඒකක (ලකුණු 02)

03 (i) එකඟ නොවේ.

- සහනාධාරයෙන් පසුව වෙළෙඳපොළේ අලෙවිවන ප්‍රමාණය සහනාධාරයට පෙර පැවති සමතුලිත නිමැවුම් ප්‍රමාණයට වඩා වැඩි වන අතර නිෂ්පාදකයාට ඒකකයකට ලැබෙන මිල ද පෙරට වඩා වැඩිවන බැවින් නිෂ්පාදක අතිරික්තය ඉහළ යයි. එමෙන්ම සහනාධාරයට පසු වෙළඳපොළෙන් අඩු මිලක් යටතේ වැඩි භාණ්ඩ ප්‍රමාණයක් මිලදී ගත හැකි බැවින් පාරිභෝගික අතිරික්තය ද ඉහළ යයි.
- මේ නිසා සහනාධාරයෙන් පසුව ලැබෙන මුළු ආර්ථික අතිරික්තයේ ප්‍රමාණය විශාල වන බැවින් එක්තරා දුරකට හිතකර බලපෑමක් ඇති කරනු ලබයි. (ලකුණු 2)
- නමුත් සහනාධාරයට පසු වැඩිපුර ඒකකයන්හි ආන්තික ප්‍රතිලාභ ප්‍රමාණය, එම නිෂ්පාදනය බිහිකිරීමේ දී සමාජය දරන පිරිවැයට වඩා අඩු වේ. (MC>MB)

සහනාධාරයෙන් පසු ගැනුම්කරුවන් වැඩිපුර මිලදීගන්නා ප්‍රමාණයට පාරිභෝගිකයන් ලබාදෙන වටිනාකම, සහනාධාරය සඳහා රජය දරන පිරිවැයට වඩා අඩු අගයකි. ඒ අනුව නිෂ්පාදන සහනාධාරයකට පසු බිහිවන සමතුලිතයේ දී ආන්තික පිරිවැය ආන්තික ප්‍රතිලාභයට වඩා විශාල වන බැවින් එම සමතුලිතය අකාර්යක්ෂම නිමැවුම් මට්ටමක් / අධි නිෂ්පාදනයක් පිළිබිඹු කරයි. (ලකුණු 2)

(ii)




(නිවැරදි රූප සටහනට ල. 2)

සාපේක්ෂව වැඩි බදු ප්‍රමාණයක් පාරිභෝගිකයා දරයි. ල. 02

(iii)

(අ)




(උපරිම මිල සීමාව සහිත රූප සටහනට ල. 2 යි, අධි ඉල්ලුම ඒකක 100 පෙන්නුම් කිරීමට ල. 2)

(iv)




(නිවැරදි රූපසටහනට ල. 02)

(iii) (ආ) උපරිම කලුකඩ මිල

40 = 320 - 3P

P = 280 = රු. 93.33

(ඉ)




(ල. 2)

අවම මිල නියම කළ පසුව, ඉල්ලුම් ප්‍රමාණය $Q_1$ සිට $Q_2$ දක්වා අඩුවීම නිසා නිෂ්පාදනයේ සංකෝචනයක් හට ගනී. මෙහි ප්‍රතිඵල වශයෙන් සමස්ත ආර්ථික අතිරික්තය පෙරට වඩා අඩු වේ.

ඉහත රූප සටහනට අනුව අවම මිලට පෙර ආර්ථික අතිරික්තය a + b + c + d + e ප්‍රදේශයෙන් පෙන්නුම් කරයි. අවම මිලට පසු ඉල්ලුම අඩු වීම නිසා ඌන නිෂ්පාදනයක් හට ගතහොත් සමස්ත ආර්ථික අතිරික්තය a + b + e ප්‍රදේශයට සීමාවේ.

ඒ අනුව අවම මිලෙන් පසු ආරථික අතිරික්තය c + d ප්‍රදේශයෙන් පෙන්නුම් කරන ප්‍රමාණයෙන් අඩු වේ. (ලකුණු 01)

04 (i) (අ) අසත්‍ය (ආ) සත්‍ය (ඇ) සත්‍ය (ඉ) සත්‍ය (ල 0.5 බැගින් ල. 02)

(ii) ක්‍රම ක්ෂය ගාස්තු

ප්‍රාග්ධන වත්කම් නිෂ්පාදන ක්‍රියාවලියට යොදාගැනීම නිසා ක්ෂයවීමට පාත්‍රවීමෙන් හෝ යල් පැනීමෙන් ජීව කාලය අවසන් වේ. එවිට ඒවා ප්‍රතිසම්පාදනය කර ගැනීමට ආයතනය කිසියම් මුදලක් වාර්ෂිකව වෙන් කරනු ලබයි. මෙසේ වාර්ෂිකව වෙන් කරනු ලබන මුදල ක්‍රම ක්ෂය ගාස්තු ලෙස හැඳින්වේ. (ල. 2)

- ආර්ථික ක්ෂය වීම්

ආර්ථික ක්ෂයවීම් යනුවෙන් අදහස් වන්නේ යම් දෙන ලද කාලයක් තුළ නිෂ්පාදන ක්‍රියාවලියේදී ප්‍රාග්ධන වත්කම්වල වෙළඳපොල වටිනාකමේ සිදුවන පහළ බැසීමයි. මෙම සිද්ධියට අනුව වර්ෂය ආරම්භයේදී ප්‍රාග්ධන තොගයේ වටිනාකම සහ වර්ෂය අවසානයේදී ප්‍රාග්ධන තොගයේ වටිනාකම අතර වෙනස්වීම් ආර්ථික ක්ෂයවීම් වේ.(ල. 02)

(iii) මෙම රූප සටහනට අනුව

TR මුළු අයභාරය = 250 x 200 = 50000/-

TC මුළු පිරිවැය = 300 x 200 = 60000/-

TFC මුළු ස්ථාවර පිරිවැය = 20000/-

TVC මුළු විචල්‍ය පිරිවැය = 60000 - 20000 = 40000/- (ල. 02)

මෙම තොරතුරුවලට අනුව මුළු අයභාරයෙන් විචල්‍ය පිරිවැය පියවාගෙන ස්ථාවර පිරිවැයෙන් කොටසක් හෝ (රු. 1000/-) පියවාගත හැකිව තිබෙන නිසා ආයතනය තම නිමැවුම වර්තමාන මට්ටමේම පවත්වා ගැනීම ලාභ උපරිම කිරීමට / අලාභ අවම කිරීමට හේතු වේ. (ල. 2)

(iv) පරිමාණුකූල පිරිමැසුම් යනු දිගුකාලයේ දී නිෂ්පාදන ආයතනයක් නිෂ්පාදනය ප්‍රසාරණය කිරීමේ දී ආයතනයේ සාමාන්‍ය පිරිවැය (ඒකක පිරිවැය) පහළ බැසීමයි. (ආයතනයක නිෂ්පාදන ධාරිතාව පුළුල් කිරීමත් සමඟ නිෂ්පාදන සාධකවල කාර්යක්ෂමතාව ඉහළ යාමත් නිෂ්පාදන යෙදවුම්වල මිල පහත වැටීමත් නිසා අත්පත් කරගත හැකි මූල්‍ය ප්‍රතිලාභයක් ලෙස පරිමාණුකූල පිරිමැසුම් හැඳින්වේ.)

(v) 1. නිෂ්පාදනය සුවිශේෂිවීම.

2. එක් ආයතනයක් පමණක් නිෂ්පාදනයේ නිරත වීම.

3. ප්‍රවේශයට බාධා පැවතීම.

4. වෙළඳපොළ තොරතුරු අපූර්ණ වීම හා පිරිවැයකින් තොරව ලබාගත නොහැකි වීම. (ල. 4)

(vi) මුළු අයභාරය TR = ඒකක මිල x අලෙවි ප්‍රමාණය
= රු 200 x 30
= රු 6000/- (ල. 1)

ATC (සාමාන්‍ය මුළු පිරිවැය) = AVC + AFC = රු. 120 + රු. 70
= ATC x Q
= රු 190 x 30 = රු. 5700/-
(ල. 1)

TVC = AVC x Q = රු 120 x 30 = රු 3600

නිෂ්පාදක අතිරික්තය = මුළු අයභාරය - මුළු විචල්‍ය පිරිවැය
= TR - TVC
= රු 6000 - 3600
= රු 2400/- (ල. 1)

ආර්ථික ලාභ = TR - TC
= රු 6000 - රු 5700 (ල. 1)
= රු 300/-

05 (i) අතරමැදි පරිභෝජන වියදම - වැටුප් හා වේතන - ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය - නිෂ්පාදනය මත අයකරන වෙනත් ශුද්ධ බදු (කරුණකට ල. 1 බැගින් ල. 4)

(ii) දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයට ඇතුළත් නිෂ්පාදනය කරන ලද මූල්‍ය නොවන ස්ථාවර වත්කම් යනු වසරකට වඩා වැඩි කාලයක් තුළ අඛණ්ඩව හෝ නැවත නැවතත් නිෂ්පාදන ක්‍රියාවලියට යොදාගත හැකි ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර උපකරණ, මහාමාර්ග ආදී ස්ථාවර වත්කම් වේ. (ල,1)
ආර්ථික වටිනාකමක් සහිත ස්වභාවික සම්පත් ස්වාධීකාර හා බලපත්‍ර ආදී ගිවිසුම් කීර්ති නාමය පෙළඳ නාම හා සන්නාම ආදී වෙනත් අලෙවි වත්කම් නිෂ්පාදනය නොකළ මූල්‍ය නොවන වත්කම් වේ.
මෙවැනි නිෂ්පාදනය නොකළ මූල්‍යමය නොවන වත්කම් හිමිකර ගැනීම සහ අහිමි කර ගැනීම අතර වෙනස ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය ගණනය කිරීමේදී සැලකිල්ලට ගනී. (ල. 1)

(iii) (අ) මූලික මිල යටතේ දළ එකතු කළ අගය

| | | |
|---|---|---|
| දළ දේශීය නිෂ්පාදනය | 11000 | |
| (අඩුකලා) නිෂ්පාදිතය මත ශුද්ධ බදු | 650 | |
| මූලික මිල යටතේ දළ එකතු කළ අගය රු. බිලියන | 10350 | (ලකුණු 02) |

(ආ)

| | | |
|---|---|---|
| ජංගම ගිණුමේ ශේෂය | 200 | |
| (අඩුකලා) ශුද්ධ අපනයන | 100 | |
| විදේශ ඉතුරුම් | 300 | (ලකුණු 02) |

(ඉ)

| | | |
|---|---|---|
| දළ දේශීය නිෂ්පාදනය | 11000 | |
| එකතුකලා විදේශීය ඉතුරුම් | 300 | |
| වැය කළ හැකි දළ ජාතික ආදායම | 11300 | (ලකුණු 02) |

(iv) (අ) විවෘත ආර්ථිකයකට සමාහාර වියදම් ශ්‍රිතයෙන් පෙන්නුම් කරන්නේ එක් එක් ආදායම් මට්ටම්වල දීඅවසාන නිෂ්පාදිතය මිලට ගැනීමට නිෂ්පාදන ආයතන, කුටුම්භ, රජය සහ විදේශ අංශය විසින් වැය කරන මුළු මුදල් ප්‍රමාණයේ වටිනාකමයි. ඒ අනුව විවෘත ආර්ථිකයක සමාහාර වියදම් ශ්‍රිතය, සමාහාර පරිභෝජන, ආයෝජන, රාජ්‍ය පරිභෝජනය සහ ශුද්ධ අපනයන යන ශ්‍රිතයන්ගේ එකතුවට සමාන වේ. (ලකුණු 02)

(ආ) සමාහාර වියදම් ශ්‍රිතය හා සමතුලිතය පහත පරිදි රූප සටහනකින් දැක්විය හැකිය.




(නිවැරදි රූප සටහනට ල. 02)

(v) (අ) $Y = C + I + G + NX$

$Y = 50 + 0.8\ Yd + 120 + 200 + (-100)$

$= 50 + 0.8\ (Y-T+Tr) + 220$

$= 50 + 0.8\ (Y-80+55) + 220$

$= 50 + 0.8Y-64+55 + 220$

$Y =$ රු.බි. 1250

වැයකළ හැකි පුද්ගලික ආදායම

$Yd = Y - T + Tr$

$= 1250 - 80 + 55$

$=$ රු.බි. 1225

විකල්ප $Yd = C + S$

$C = 50 + 0.8 \times 1250 - 64 + 44$

$= 1030$

$S = -50 + 0.2 \times 1250 - 64 + 44$

$= 195$

$Yd = 1030 + 195$

$=$ රු.බි. 1225 (ලකුණු 02)

(ආ) MPC = 0.8 නිසා රාජ්‍ය වියදම් ගුණකය 5 ක් වේ.

$$\frac{\text{නිමැවුම් පරතරය}}{\text{ආණ්ඩුවේ වියදම් ගුණකය}} = \frac{500}{5}$$

රුපියල් බිලියන 500 ක ධන නිමැවුම් පරතරය ඉවත් කිරීම සඳහා රජය වියදම් රුපියල් බිලියන 100 කින් කපා හැරිය යුතුය. (ලකුණු 02)

**("ආ") උපකොටස**

**(මෙම කොටසින් අවම වශයෙන් ප්‍රශ්න 02 ක් වත් තෝරා ගත යුතුය.)**

06 (i) ♦ පොදු පිළිගැනීම ♦ පහසුවෙන් හඳුනාගත හැකි වීම. ♦ පහසුවෙන් ප්‍රවාහනය කළ හැකි වීම. ♦ කුඩා ඒකකවලට බෙදා වෙන්කිරීමේ පහසුව ♦ කල්පවත්නා බව ♦ සමජාතීය බව ♦ අනුකරණය අපහසු වීම. (ඕනෑම කරුණු 04 කට ල. 4 යි.)

(ii) $M_1$ { මහජනයා සතු කාසි හා නෝට්ටු
වාණිජ බැංකු වෙතැති, මහජනයා සතු ඉල්ලුම් තැන්පතු }

$TSD_P$ වාණිජ බැංකු වෙතැති මහජනයා සතු ඉතුරුම් හා කාලීන තැන්පතු

ගැළපුම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු ($M_2$+ ගැළපුම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු) (ලකුණු 04)

(iii) (අ) සේවා වියුක්තිය - අවිධිමත් අංශයේ රැකියා සඳහා යොමු වීමෙන් සේවා වියුක්තිය අඩු වේ.

(ආ) විනිමය අනුපාතය - මෙරට උද්ධමනය හා විදේශවල උද්ධමනය සැසඳිය යුතුය. දේශීය උද්ධමනය හමුවේ විනිමය අනුපාතය ක්ෂය වීමට ලක් වේ.

(ඉ) ආනයන -දේශීය භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහළ යාම නිසා දේශීය භාණ්ඩවලට ඇති ඉල්ලුම අඩුය. ආනයනය ලාභදායි වේ. ආනයන ඉල්ලුම වැඩි වේ.

(ඊ) ගෙවුම් ශේෂය - දේශීය භාණ්ඩවල මිල ගණන් ඉහළ යාමෙන් අපනයන තරඟකාරීත්වය අඩු වේ. අපනයන අධෛර්යමත් වී ගෙවුම්ශේෂ දුෂ්කරතා ඇතිවේ. (ආනයන ධෛර්යවත් වේ.)(ලකුණු 1 බැගින් ල. 04)

(iv) i)

(

| වගකීම් | | වත්කම් | |
|---|---|---|---|
| ප්‍රාග්ධනය | 100 | මුදල් හා සංචිත | 200 |
| තැන්පතු | 1000 | ණය | 900 |
| | 1100 | | 1100 |

(ලකුණු 01)

ii) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය $= 20\%$

තැන්පතු ප්‍රමාණය $= 1000$

අවශ්‍ය සංචිතය $= \frac{20}{100} \times 100$

$= 200$

අවශ්‍ය සංචිත පවතින සංචිතයට සමාන වේ. එහෙයින් බැංකු පද්ධතිය සතුව අතිරික්ත සංචිත නොමැත. (ලකුණු 01)

iii) අතිරික්ත සංචිතයක් නොමැති හෙයින් බැංකු පද්ධතියට තවදුරටත් නව තැන්පතු නිර්මාණය කළ නොහැක. (ලකුණු 01)

iv) බැංකු පද්ධතිය සපයා ඇති ණය ප්‍රමාණය 700 ක් වන විට නව ශේෂ පත්‍රය පහත දැකවේ.

| වගකීම් (රු.මි.) | | වත්කම් (රු.මි.) | |
|---|---|---|---|
| ප්‍රාග්ධනය | 100 | මුදල් හා සංචිත | 200 |
| තැන්පතු | 800 | ණය | 700 |
| | 900 | | 900 |

(ලකුණු 01)

v) පවතින සංචිතය = 200

අවශ්‍ය සංචිතය = ව්‍යවස්ථාපිත සංචිත x තැන්පතු අනුපාතය

= 0.20 x 800 = 160

අවශ්‍ය සංචිතය = පවතින සංචිත - අවශ්‍ය සංචිත

= 200 - 160 = 40 (ලකුණු 01)

vi) නව තැන්පතු ප්‍රමාණය = තැන්පතු ගුණකය x අතිරික්ත සංචිත

$= \frac{1}{0.2} \times 40 = 200$ (ලකුණු 01)

vii) ශේෂ පත්‍රය

| වගකීම් | | වත්කම් | |
|---|---|---|---|
| ප්‍රාග්ධනය | 100 | මුදල් හා සංචිත | 200 |
| තැන්පතු | 1000 | ණය | 900 |
| | 1100 | | 1100 |

(ලකුණු 02)

07 (i) (අ) නිෂ්පාදනයේ සෘණ බාහිරතා අවස්ථාවකි.

(ආ) පාරිභෝජනයේ සෘණ බාහිරතා අවස්ථාවකි.

(ඇ) නිෂ්පාදනයේ ධන බාහිරතා අවස්ථාවකි.

(ඉ) පාරිභෝජනයේ ධන බාහිරතා අවස්ථාවකි. (එක ලකුණ බැගින් ල. 04)

(ii) (අ) අර්ධ පොදු භාණ්ඩ (ආ) ශුද්ධ පොදු භාණ්ඩ

(ඇ) ශුභ සාධන භාණ්ඩ (ඉ) පොදු සම්පත් (ලකුණු 04)

(iii) (අ) නියාමනහරණය යනු ආණ්ඩුව විසින් ව්‍යාපාර ආයතන මෙහෙයවීම සම්බන්ධයෙන් අනුගමනය කළ පාලනය ක්‍රමයෙන් ලිහිල් කිරීම හෝ ඉවත් කිරීමේ ක්‍රමවේදයයි. (ලකුණු 02)

(ආ) නාස්තිය හා දූෂණය අවමවීම, සමස්ත නිෂ්පාදන ධාරිතාව ඉහළ යාම, සම්පත් කාර්යක්ෂමව බෙදා හැරීමට ඉඩ කඩ ලැබීම, සේවා නියුක්ති අවස්ථා වැඩිවීම, ආර්ථික වර්ධනය වේගවත් වීම, තිරසර සංවර්ධනයට දායක වීම. (ලකුණු 04)

(iv) නාමික වශයෙන් රජයේ ආදායම 54% ක වර්ධනයක් වාර්තා කළ අතර එය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් වශයෙන් 11 % ක වර්ධනයකි.

බදු ප්‍රතිසංස්කරණ රාශියක් ආදායම් රැස්කිරීමට හේතු වීම. උදා:- ආදායම් බදු එකතු කළ අගය මත බද්ද නිෂ්පාදන / සුරා බද්ද විශේෂ වෙළඳ බද්ද ආනයන බද්ද.

2022 වර්ෂයේ හඳුන්වාදුන් සමාජ ආරක්ෂණ බද්ද

බදු නිදහස් සීමාව සංශෝධනය කිරීම, බදු ආදායම් කාණ්ඩ අනුව පුද්ගලික ආදායම් බදු ව්‍යුහයට කරන ලද සංශෝධන, විශේෂිත වෘත්තිකයින්ට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වීම අනිවාර්ය කිරීම, සංස්ථාපිත ආදායම් බදු අනුපාතය ඉහළ නැංවීම සහ සංස්ථාපිත ආදායම් බදු වලට සම්බන්ධ සහනදායී අනුපාත ඉවත් කිරීම. (ඕනෑම කරුණු තුනකට ල. 06)

08 (i) (අ) ස්ථිතික වාසි යනු :- නිෂ්පාදනය හා පරිභෝජනය මුල්කරගෙන රටකට ස්වභාවිකව උරුම වී ඇති වාසියකි.

(ආ) ගතික වාසි යනු :- තාක්ෂණයේ දියුණුව භාණ්ඩ ප්‍රභේදනය රාජ්‍යය ප්‍රතිපත්ති වෙළෙඳ ගිවිසුම් ආදිය මගින් රටවල් නිර්මාණය කරගනු ලබන තත්වයක් නිසා හටගන්නා වාසියකි.

(ඉ) තරඟකාරීත්ව වාසි යනු :- කිසියම් භාණ්ඩයක් පාරිභෝගිකයන් වෙත සැපයීමේදී සෙසු තරඟකරුවන්ට වඩා වැඩි වටිනාකමක් පාරිභෝගිකයන් වෙත ලබාදිය හැකි වීමයි.(1බැගින් ල. 03)

(ii) සඵල ආරක්ෂණය යනු :- ආනයන තීරු බද්දක් පැනවීම මගින් දේශීය නිෂ්පාදකයාට ලැබෙන සැබෑ ආරක්ෂණයයි. (ලකුණු 01)

$$ERP = \frac{V_1 - V_0}{V_0} \times 100$$ (ලකුණු 01)

ERP - සඵල ආරක්ෂණ අනුපාතය

$V_1$ - තීරු බදු පැන වූ විට දේශීය නිෂ්පාදකයාගේ එකතු කළ අගය

$V_0$ - නිර්බාධ වෙළෙඳාම යටතේ දේශීය නිෂ්පාදනයේ එකතුකල අගය (ලකුණු 02)

(iii) ◆ සලාක කිරීම හෙවත් කෝටා නියම කිරීම. ◆ දේශීය නිෂ්පාදකයන්ට සහනාධාර හෝ දිරිගැන්වීම් ලබා දීම. ◆ ස්වෙච්ඡාවෙන් අපනයන සීමා පනවා ගැනීම. ◆ විදේශ විනිමය පාලනය ◆ අපනයන හා ආනයන සීමා පැනවීම ◆ වෙළෙඳ සම්බාධක පැනවීම. ◆ පරිපාලන හා තාක්ෂණික ප්‍රමිතීන් නියම කිරීම. (කරුණු 04 ට ල. 04)

(iv) විවිධ රටවල් අතර තීරු බදු හා තීරු බදු නොවන බාධකවලින් තොරව භාණ්ඩ සේවා සහ නිෂ්පාදන සාධක හුවමාරු කරගැනීමේ ක්‍රියාවලිය ආර්ථික ඒකාබද්ධ වීම් ලෙස හඳුන්වයි. (ලකුණු 01)

ස්වරූප ◆ වරණීය වෙළෙඳ කලාප ◆ නිදහස් වෙළෙඳ කලාප ◆ තීරු බදුසංගම් ◆ පොදු වෙළෙඳපොළ ◆ ආර්ථික හා මූල්‍ය සංගම් ◆ පූර්ණ ආර්ථික ඒකාබද්ධ වීම් (ලකුණු 04)

(v) i) ජංගම ගිණුමේ ශේෂය = වෙළෙඳ ශේෂය + සේවා ශේෂය + ආදයම් ශුද්ධ ශේෂය + වර්තන සංක්‍රාම

- 22,000 = X + 9000 + (-9000) + 48000

- 22,000 = X + 48000 (ලකුණු 01)

- 22,000 - 48000 = X

(රු.මි.) - 70000 = X (වෙළෙඳ ශේෂය)

ii) ආනයන වටිනාකම :-

වෙළෙඳ ශේෂය = අපනයන වටිනාකම - ආනයන වටිනාකම

-70000 = 274000 - ආනයන වටිනාකම

-70000 - 274000 = - ආනයන වටිනාකම

-344000 = - ආනයන වටිනාකම

(රු.මි.) 344000 = ආනයන වටිනාකම (ලකුණු 01)

iii) භාණ්ඩ සේවා ආදායම් ශුද්ධ ශේෂය

= (-70000) + 9000 + (-9000)

(රු.මි.) = -70000 (ලකුණු 01)

iv) දළ දේශීය නිෂ්පාදිත වියදම = ද.දේ.වියදම + වෙළෙඳ ශේෂය + සේවා ශේෂය

= 350000 + (70000) + 9000

= 359000 - 70000)

= 289000 (රු.මි.) (ලකුණු 01)

09 (i) දරිද්‍රතාවය ඉහළ යාම, සේවා වියුක්තිය ඉහළ යාම, ජනතාවගේ ජීවන තත්ත්වය පහළ යාම, ගෙවුම් ශේෂ දුෂ්කරතා ඇතිවීම, උද්ධමනය ඉහළ යාම, විදේශ ආයෝජන අවස්ථා අඩුවීම, අයවැය හිගය පුළුල් වීම, රාජ්‍ය ණය වැඩිවීම. (කරුණු 4 ල. 04)

(ii) ◆ පහළ මානව සංවර්ධනයක් සහිත රටවල් ◆ මධ්‍යම මානව සංවර්ධනයක් සහිත රටවල්

◆ ඉහළ මානව සංවර්ධනයක් සහිත රටවල් ◆ ඉතා ඉහළ මානව සංවර්ධනයක් සහිත රටවල්.

(නිවැරදි අවස්ථා හතරකට පමණක් ල. 04)

(iii) ◆ තිරසර සංවර්ධනය යන්නෙන් අදහස් වන්නේ වර්තමාන පරපුරේ අවශ්‍යතා ඉටු කර ගැනීමේදී අනාගත පරපුරේ අවශ්‍යතා ද සපුරා ගැනීමේ ඉඩ කඩ ලබා දෙමින් ලබා ගන්නා වූ සංවර්ධනයයි.

◆ තිරසර සංවර්ධනයේදී ප්‍රධාන පැතිකඩ තුනක් පිළිබඳව සැලකිල්ලට ගත යුතුය. එනම් ආර්ථික පැතිකඩ සමාජීය පැතිකඩ සහ පාරිසරික පැතිකඩයි.

◆ එම පැතිකඩ තුන අතර එකිනෙක සම්බන්ධතාවයක් පවතින බැවින් තීරණ ගැනීමේදී ඒවා අතර සම්බන්ධතාවයක් පවතින ආකාරයට තීරණ ගැනීමට සැලකිලිමත් විය යුතුය.

◆ තිරසර සංවර්ධනය යනු ක්‍රියාවලියකි. අවකාශය වෙලාව අතර ඒකාබද්ධවීමේ මූලධර්මය සියලු තීරණවලට අදාළ කර ගනී. එමගින් සම්පත් ක්ෂයවීම, සෞඛ්‍යමය රැකවරණය, සමාජ බැහැර කිරීම, දරිද්‍රතාව, විරැකියාව යනාදී විශේෂිත ගැටලු හඳුනාගනී.

◆ තිරසර සංවර්ධනය යනු සංකල්පීය රාමුවකි. එමගින් ලෝක දෘෂ්ටිය වඩාත් පරිපූර්ණ හා සමබර එකක් බවට පත් කරයි. (කරුණු එකකට ලකුණු එක බැගින් ල. 04)

(iv) ◆ දිළිඳු ජනයා ඉලක්ක කරගත් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. එනම් දිළිඳු ජනයාගේ ආදායම ජනනනය වන ආකාරයේ ආදායම් උත්පාදන වැඩ සටහන් වලට දිළිඳු ජනයා සම්බන්ධ කර ගැනීම.

◆ දේශීය කෘෂිකර්මාන්තය වැඩි දියුණු කිරීමට ක්‍රියාමාර්ග ගැනීම.

◆ අධ්‍යාපනය සෞඛ්‍ය ක්ෂේත්‍රවල කරන ආයෝජනය ඉහළ දැමීම.

◆ රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ හවුල්කාරීත්වය වැඩි දියුණු කිරීම.

◆ රාජ්‍ය අංශයේ රැකියා අවස්ථා සෑම අයෙකුටම විවෘත කිරීම.

◆ මූල්‍ය වෙළඳපොළ ශ්‍රම වෙළෙඳපොළ සහ ඉඩම් ප්‍රතිසංස්කරණ යනාදී ප්‍රතිසංස්කරණ ඇති කිරීම.

◆ ආණ්ඩුවේ වියදම් ප්‍රතිපත්තිය දිළිඳු ජනයා ඉලක්ක කරගෙන වැඩි වශයෙන් ක්‍රියාත්මක කිරීම. එනම් රාජ්‍ය අයවැයෙන් වැඩි වශයෙන් දිළිඳුකම අවම කිරීමේ ක්‍රියාමාර්ග කෙරෙහි අවධානය යොමු කිරීම.

උදා:- කුඩා ව්‍යවසායක ව්‍යාපාර දිරිගැන්වීම සහ ශක්තිමත් කිරීම.(කරුණු 04 ට ල. 04)

(vi) ◆ ජනගහන වර්ධන වේගය පහත වැටීම.
◆ වයස් ව්‍යුහය විශාල වශයෙන් වෙනස් වීම.
◆ ළමා ජනගහනය විශාල වශයෙන් අඩු වීම.
◆ වැඩිහිටි ජන සංඛ්‍යාව වැඩි වීම.
◆ දළ උපත් හා දළ මරණ අනුපාතය අඩුවීම.
◆ ස්ත්‍රී පුරුෂ ජන අනුපාතය අතර වෙනස්කම් හට ගැනීම. (කරුණු 4 ට ල. 4)

10 (i) (අ) රටක නිෂ්පාදන හා හුවමාරු ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීමට හා ජනතාවගේ ජීවන තත්වය වැඩි දියුණු කිරීමට ඉවහල්වන ප්‍රාග්ධනය යටිතල පහසුකම් ලෙස හඳුන්වයි. (ලකුණු 01)

◆ ආර්ථික යටිතල පහසුකම් දෘඪ පහසුකම් හා මෘදු පහසුකම් ලෙස වර්ග කෙරේ.

◆ දෘඪ පහසුකම් :- මහා මාර්ග, අධිවේගී මාර්ග, පාලම්, උමං, දුම්රිය මාර්ග, වාරිමාර්ග, ගුවන්තොටුපොළ, වරාය, විදුලි සංදේශ, ප්‍රවාහන පද්ධති

මෘදු පහසුකම් :- වෘත්තීය පුහුණු වැඩසටහන්, මූල්‍ය ආයතන පහසුකම්, පර්යේෂණ හා සංවර්ධන පහසුකම්, තාක්ෂණ හුවමාරුව. (ලකුණු 01)

(ආ) ආර්ථික අර්බුධය මගින් අවධානයට ලක්විය හැකි කුටුම්බ කෙරෙහි ඇතිවිය හැකි විෂමාකාර මෙන්ම දිගුකල් පවත්නා බලපෑම සැලැකිල්ලට ගනිමින්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ රටේ සමාජ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීම සඳහා ආරම්භ කල වැඩසටහනක් ලෙස "අස්වැසුම" වැඩ සටහන හැඳින්විය හැකිය.

- සමෘද්ධි සංවර්ධන වැඩසටහන වෙනුවට හඳුන්වාදුන් සමාජ සුබසාධක ප්‍රතිලාභ වැඩසටහනකි.
- මේ යටතේ සංක්‍රාන්ති, අවදානමට ලක් වූ, දුප්පත් සහ අන්ත දුප්පත් යන සමාජ කාණ්ඩ 04 ක් යටතේ සුබ සාධක ප්‍රතිලාභ ගෙවීම් සිදු කෙරේ. (ලකුණු 01)

ප්‍රතිලාභ අවශ්‍ය කෙරෙන කාණ්ඩ ඵලදායි ලෙස ඉලක්ක කිරීම සහතික කිරීම සඳහා වැඩිදියුණු කළ තොරතුරු තහවුරු කිරීමේ පද්ධතියක් සමඟ මෙම වැඩ සටහන නිර්මාණය කර ඇති අතර නිරන්තර සමාලෝචන සමඟ තෝරා ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමටද පියවර රැසක් ගෙන ඇත.

- වැඩ සටහන ආරම්භයේදී මිලියන 3.7 ක අයදුම්කරුවන් අතරින් මිලියන 1.4 ක අයදුම්කරුවන් පිරිසක් තෝරා ගෙන ඇත. මේ යටතේ 2023 වසර තුළදී රුපියල් බිලියන 53.8 ක් පමණ බෙදා දී ඇත. (ල. 01)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

- වැඩ සටහනෙහි අරමුණ සමග රජයේ ප්‍රයත්න ප්‍රශංසනීය වුවද, ආර්ථික අර්බුදයෙන් පසුව දරිද්‍රතාව, අවදානමට ලක්වීමේ හැකියාව සහ විෂමතා පිළිබඳව ජාතික මට්ටමේ සංඛ්‍යාලේඛන නොමැතිවීම ගැටළුකාරී තත්වයක් වන අතර එය දරිද්‍රතාව තුරන් කරවීම සඳහා මෙන්ම සමාජ සහනාධාර ප්‍රයත්න නිසිකලට ක්‍රියාත්මක කිරීම කෙරෙහි බාධා පමුණුවයි. (ල. 01)

(ii) හේතු :-

- Covid වසංගතය හේතුවෙන් වසර 03 ක් පමණ මාර්ගගත හා භෞතික ලෙස මිශ්‍ර ඉගෙනුම් ක්‍රමවේද භාවිතා කිරීම.
- අධ්‍යයන වර්ෂයක් ප්‍රමාද වීමට අදාළව ඇති වූ ගැටළුකාරී තත්වයන්.
- ජාතික මට්ටමේ විභාග රජය විසින් පැවැත්වුවද 11 සහ 13 යන ශ්‍රේණිවල ශිෂ්‍ය කණ්ඩායම් දෙක බැගින් විභාග සඳහා මුහුණදීමට එකම කාලය තුළ සූදානම් කිරීම හේතුවෙන් එම සිසුන්ට පාසල්වලින් සම්පත් ලබා ගැනීමේදී අවාසි සහගත තත්වයන් නිර්මාණය වීම.
- සිසුන් පාසල් අධ්‍යාපනය හැර යාමේ ප්‍රතිශතය වර්ධනය වීම. (ලකුණු 02)

ක්‍රියාමාර්ග :-

- පාසල් සඳහා ආහාර ලබාදීමේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම
- නොමිලේ පෙළ පොත් ලබාදීම.
- නොමිලේ පාසල් නිල ඇඳුම් සහ පාසල් පාවහන් ලබාදීම. (ලකුණු 02)

(iii) ◆ නියාමන ක්‍රියාවලියේ අහිතකර වෙනස්වීම් ◆ ගිවිසුම උල්ලංඝණය කිරීම. ◆ සිවිල් අරගල ◆ රජයේ විශ්වාසනීයත්වය බිඳ වැටීම. ◆ ව්‍යාපාර පවරා ගැනීම හෝ ජනසතු කිරීම. ◆ යුද්ධ

(කරුණු 1 ට ලකුණු 1 බැගින් ලකුණු 04)

(iv)

- ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩ සටහන ආරම්භ කිරීම සහ සාර්ථකව පවත්වාගෙන යෑම.
- විදේශීය ජංගම ගිණුම 2023 වසරේ දී අතිරික්තයක් වාර්තා කිරීම සහ වෙළෙඳ ගිණුමේ හිඟය සැලකිය යුතු ලෙස අඩුවීම.
- අපනයන ආදායම අඩුවීමට සාපේක්ෂව ආනයන වියදම විශාල වශයෙන් අඩුවීම.
- සංචාරක පැමිණීමේ අපේක්ෂිත මට්ටමට යථා තත්වයට පත්වීමත් සමග සංචාරක ඉපයීම් කැපී පෙනෙන ලෙස ඉහළ යෑම.
- විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ කැපී පෙනෙන ලෙස වර්ධනය වීම.
- දේශීය විදේශ විනිමය වෙළෙඳපොළේ ද්‍රවශීලතා තත්වය සහ වෙළෙඳපොළ අපේක්ෂාවන් වැඩි දියුණු වීම.
- ශ්‍රී ලංකා රුපියල් කැපී පෙනෙන ලෙස අතිප්‍රමාණය වීම. (කරුණු 4 කට ලකුණු 04)

(v)

- ශ්‍රී ලංකාව සඳහා ඇති විශාලතම අපනයන ගමනාන්තයන් සහිත සංවර්ධිත රටවල මන්දගාමී වර්ධනය නිසා ශ්‍රී ලංකාවේ අපනයන කාර්යසාධනය කෙරෙහි අහිතකර ලෙස බලපෑම.
- සංවර්ධිත රටවල ආර්ථික කාර්යයන්හි පසුබෑම නිසා එම රටවල වියදම් කිරීමේ ඉහළ හැකියාවක් සහිත සංචාරකයින්ගේ පැමිණීම අපේක්ෂිත ආකාරයට සිදු නොවීම.
- ගාසා තීරයේ ගැටුම්, රතු මුහුදේ සිදුවන අඛණ්ඩ පහරදීම් වැනි භූ දේශපාලනික කම්පන හේතුවෙන් සැපයුම් දාම කෙරෙහි අහිතකර ලෙස බලපෑම.
- ගෝලීය බලශක්ති මිල ගණන් ඉහළ යාම නිසා ආනයන වියදම් වැඩිවීමෙන් වෙළඳ හිඟය පුළුල් වීම.
- උද්ධමනාත්මක බලපෑම් ඇතිවීම.
- කාලගුණය සම්බන්ධ අහිතකර බලපෑම් ඇතිවීමෙන් ආහාර මිල ගණන් ඉහළ ගොස් මිල ස්ථායිතාවයට බලපෑම් ඇතිවිය හැකිවීම. (ඕනෑම කරුණු 03 කට ලකුණු 03)

PAST PAPERS WIKI



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!


PARCEL NO
LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න